# The SIGNALLER

17

SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015





...ධිපතිතුමන් ලෙස මේජර් ජෙනරාල් කේ ආර් පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී යූඑස්ඒසීජීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමා සුභ මොහොතින් නව කාර්යාලයේ වැඩ භාරගත් මොහොත



2015.05.07 දින නව සංඥා බලකාධිපතිතුමන් සිය ධූරයෙහි රාජකාරීන් භාර ගැනීම නිමිත්තෙන් පිරිනැමූ සම්මාන පෙළපාලිය

The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015

## කතුවැකිය

ශ්‍රී ලංකා සංඥා බලකායට වසර 72 ක් සපිරෙන ඓතිහාසික අවස්ථාවේ වාර්ෂිකව පලකරනු ලබන "ද සිග්නලර්" සඟරාවේ ප්‍රධාන කර්තෘ වශයෙන් කටයුතු කිරීමට ලැබීම පිළිබඳව අවංකවම මා සතුටු වෙමි.

මීට වසර දාහතකට ප්‍රථම ආරම්භ කරන ලද මෙම සඟරාව තුලින් සංඥා බලකායේ වසරක් පුරා සිදුවුවාවු කාලීන සිදුවීම් සෑම සාමාජිකයෙකුටම දැන ගැනීමටත්, ඔවුන්ගේ නිර්මාණශීලී හැකියාව විදහා දැක්වීමට හා තම දැනුම වර්ධනය කර ගැනීමටත් මෙම සඟරාව මනා පිටුවහලක් වන බැව් නොඅනුමානය. අප වීරෝධාර සෙබළුන්ට මෙම කලාපය තුලින් තම නිර්මාණාත්මක අදහස් එලිදැක්වීමට ඉතා හොඳ තෝතැන්නක් සැකසෙන අතර, ඒ සඳහා සියළුම මූලස්ථාන හා ඒකකයන්හී නිළධාරී / සෙසු නිළයින් විසින් දක්වන ලද සහයෝගය ඉතා අගය කොට සලකමි.

තාක්ෂණයෙන් පිරීපුන් හමුදාවක් ගොඩ නැංවීමෙහිලා යන ගමන් මඟෙහි නවක සාමාජිකයින් හට මෙහි පල කරන අධ්‍යාපනික ලිපි මගින් ලබා ගන්නා තොරතුරු මහඟු අත්වැලක් වන අතර, ලෝකයේ දැනට පවතින තාක්ෂණික දියුණුවත් සමඟ ආරක්ෂක හමුදාවන් භාවිතා කරන තාක්ෂණික උපකරණ / උපක්‍රම හා විශේෂිත වූ හමුදාමය පරිගණක වැඩසටහන් පිළිබඳව විශේෂ අවධානය යොමුකර එයට මුහුණදීම සඳහා සංඥා බලකාය වශයෙන් සුවිශේෂ වූ කාර්යභාරයක් ඉටුකල යුතුව ඇති බැව් සිහිපත් කිරීමට කැමැත්තෙමි.

අවසාන වශයෙන් මෙම සඟරාව සිත්ගන්නා සුළු අයුරින් හා හරවත් අයුරින් සකස් කර මුද්‍රණය කිරීම සඳහා දායක වූ සංඥා බලකාධිපතිතුමා ඇතුළු සියළුම නිළධාරීන් සහ සෙසු නිළයන්ටත්, කාලෝචිත හා නිර්මාණශීලී අදහස් හා නිර්මාණයන්ගෙන් දායක වූ සැමටත් කෘතඥතාපූර්වකව ස්තුතිවන්ත වන අතර, මෙවර කලාපය අලංකාර අන්දමින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට කටයුතු කළ AMP ප්‍රින්ටින් පුද්ගලික ආයතනයේ කාර්‍යය මණ්ඩලයටත් ප්‍රධාන සංස්කාරක වශයෙන් මා ප්‍රශංසාව පුද කරමි.

ප්‍රධාන සංස්කාරක

## සංස්කාරක මණ්ඩලය

කර්නල් කේ ඒ ඩබ් එස් රත්නායක
ලුතිතන් කර්නල් බී අයි අස්සලආරච්චි යූඑස්පී පීඑස්සී
ලුතිතන් කර්නල් කේ එම් පී බණ්ඩාරනායක පීඑස්සී
මේජර් ඒ එම් ටී අමරකෝන් පීඑස්සී

## ග්‍රැෆික් නිර්මාණය

ලා/කෝ සේනාධීර කේ එම් අයි එල්
සංසෙ පීරිස් එස් ආර් ඒ එම්

## මුද්‍රණය

AMP ප්‍රින්ටින් පුද්ගලික ආයතනය
නො 54, නුවරඑළිය පාර, ගම්පොළ
දුරකථන : 077 787 5165
081 235 0345

## ලිපිනය

රෙජිමේන්තු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා සංඥා බලකාය
යුද හමුදා කඳවුර
පනාගොඩ
හෝමාගම
දුරකථන : +94112855361
ඊමේල් : rhqslsc@army.lk
වෙබ් : www.army.lk/signaller

SIGNALLER

The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015

## සංඥා බලකා ආදර්ශ පාඨය

ශ්‍රී ලංකා සංඥා බලකායෙහි ආදර්ශ පාඨය "ස්ථිර ක්ෂණික" වේ. මෙය බ්‍රිතාන්‍ය රාජකීය සංඥා බලකායද භාවිතා කළ ලතින් භාෂාවෙන් සඳහන් "Certa Cito " යන්නෙහි සිංහල පරිවර්තනය වන අතර එය ඉංග්‍රීසි භාෂාවෙන් "Swift and Sure" ලෙස සඳහන් වේ. මෙම ආදර්ශ පාඨය මගින් යුද හමුදාවෙහි පැවැත්ම උදෙසා ඉදුරාම බලපාන විශ්වාසදායී සන්නිවේදනය හා තොරතුරු හුවමාරුව සැපයීමෙහිලා සංඥා බලකායට ආවේණික වෘත්තීය නිපුණතා වරය පෙන්නුම් කෙරේ.

## සංඥා බලකා වාදනය

ශ්‍රී ලංකා සංඥා බලකායෙහි රෙජිමේන්තු වාදනය ප්‍රචලිත පැරණි ඉංග්‍රීසි ගීයක් වන "Begon Dull Care" වේ. මෙය බ්‍රිතාන්‍ය රාජකීය සංඥා බලකායට ආවේණික ගී අනුවාදනය ලෙසින් ශ්‍රී ලංකා සංඥා බලකාය වෙතද ලැබී තිබෙන අතර මෙම වාදනය සියලු අනුමත හමුදාමය උත්සව වලදීද සංඥා බලකායෙහි උත්සව අවස්ථාවලදීද සංඥා බලකාය ප්‍රධාන පෙළපාලියන්හි ගමන් ගන්නා විටදීද බලකායෙහි අනන්‍යතාවය රකිමින් වාදනය කෙරේ.

## සංඥා බලකා ධජය

ශ්‍රී ලංකා සංඥා බලකායට ආවේණික වර්ණයන් වන තද කොළ (Dark Green), තද නිල් (Dark/Oxford Blue) හා ලා නිල් (Sky Blue) යන වර්ණයන්ගෙන්ද බලකා ලාංඡනයෙන්ද සමන්විතව ශ්‍රී ලංකා සංඥා බලකා ධජය නිර්මාණය කොට තිබේ. මෙම ධජයෙහි ඉහත වර්ණයන් පිළිවෙලින් තද කොළ වර්ණය පහළින්ද තද නිල් වර්ණය මධ්‍යස්ථවද ලා නිල් වර්ණය ඉහළින්ද සිටින සේ තිරස්ව දිස්වන අතර බලකා "මර්කරී" ලාංඡනය ඉහත වර්ණ තුන පසුබිම් කොට ධජය මධ්‍යයෙහි ඉස්මතු කොට දක්වා තිබේ. මෙම ත්‍රෙවර්ණ පසුබිමක් මත පිළිබිඹු වන බලකා ලාංඡනය සහිත ධජය මගින් ගොඩ, දිය සහ අහස යන තුන් තලයෙහි ඵලදායි සන්නිවේදනය ගොඩනංවා පවත්වාගෙන යාමෙහි ශ්‍රී ලංකා සංඥා බලකාය සතු වෘත්තීයමය හැකියාව විදහාපායි.



SIGNALLER

The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015

පණිවුඩ 01 - 05
ඉතිහාසයෙන් බිඳක් 06 - 09
මතක පොතින් 10 - 62
ක්‍රීඩා 63 - 67
පාඨමාලා 68 - 73
මන්දාකිණි 74 - 86
කැටපත් පවුර 87 - 91
උපන්දින සුභ පැතුම් 92 - 98
මංගල සීනු 99 - 102
විවිධ 103 - 113
ගෞරවණීය උපහාර 114- 121

SIGNALLER








## සංඥා බලකාධිපති හා ප්‍රධාන සංඥා නිළධාරීගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බලකාය සිය අභිමානවත් 72 වන සංවත්සරය සමරන මෙම ඓතිහාසික මොහොතට සමගාමීව මෙම වසරේදී ද "ද සිග්නලර්" සඟරාවෙහි 17 වන කලාපය වෙනුවෙන් පණිවිඩයක් ගෙන ඒමට ලැබීම මා ලද ඉමහත් භාග්‍යක් මෙන්ම හා මහත් ගෞරවයක් සේ සලකමි. ප්‍රෞඪ ඉතිහාසයක් ඇති සංඥා බලකායේ සාමාජිකයින් වන අප සංඥා රාජකාරී තුලින් මෙන්ම පාබල රාජකාරී තුලින් ද, යුද හමුදාවට ලබාදුන් අසීමිත දායකත්වය සංඥා බලකාධිපති වශයෙන් මා මෙහිදී සිහිපත් කරනුයේ ඉතා අභිමානයෙනි.

සාමකාමී වාතාවරණයක් යටතේ ක්‍රියාත්මක වන රට ගොඩනැගීමේ මහඟු ක්‍රියාවලියේදී ශ්‍රම දායකත්වයෙන් මෙන්ම යුද හමුදා සන්නිවේදනයේ පෙර ගමන්කරු වන අප බලකායට පැවරෙන රාජකාරීන් කිසිදු ලෙසකින් අවම කර නොමැත. යුද වාතාවරණය සහමුලින්ම දේශයෙන් බැහැර කිරීමෙහිලා අප බලකාය ලබාදුන් මෙහෙවර අති විශිෂ්ට වූ අතර, නවීන තාක්ෂණික උපකරණ හා පරිගණක උපකරණ භාවිතා කරමින් යුද හමුදා සන්නිවේදන ජාලයන් උසස් මට්ටමකට ගෙන ඒම සඳහා කරනු ලබන ක්‍රියාවන් ද මෙහිදී අගය කල යුතුය.

එමෙන්ම අප මාතෘ භූමියට පූර්ණ කාලීන සාමය ලඟාකර දීම සඳහා තම ජීවිතය කැපකල සියළුම සංඥා බලකා නිළධාරීන්/සෙසුනිළයින් සහ සටනේදී ආබාධිත තත්වයට පත් සියළුම නිළධාරී/සෙසුනිළයින්ට මාගේ ගෞරවය හා ආචාරය පුදකිරීමටද මෙය අවස්ථාවක් කරගන්නෙමි.

ශ්‍රී ලංකා යුධ හමුදාව තුල දෛනික ලිපි හුවමාරුව තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් ඉතාමත් සීඝ්‍රයෙන් ව්‍යාප්ත කිරීමට හැකිවීම මෙන්ම දත්ත ජාල පද්ධතිය වැඩි දියුණු කරමින් විද්‍යුත් තාක්ෂණය හමුදාව තුල ව්‍යාප්ත කිරීම ශ්‍රී ලංකා සංඥා බලකාය ඉටුකල විශිෂ්ට කාර්යයක් ලෙස සඳහන් කරනුයේ ඉතාමත් ආඩම්බරයකිනි.

එමෙන්ම සංඥා බලකාය තුල ඒකක ප්‍රතිසංවිධානය කර සංඥා මූලික වැඩපල, 10 වන සංඥා රෙජිමේන්තුව (සන්නිවේදන තාක්ෂණ) ලෙස ප්‍රතිව්‍යුහ ගත කිරීම සහ සයිබර් ආරක්ෂක ඒකකයක් ස්ථාපනය කිරීමේ මූලික පියවරවල් ආරම්භ කිරීම ශ්‍රී ලංකා සංඥා බලකාය වෘත්තීමය වශයෙන් ලද විශාල ජයග්‍රහණයක් ලෙස සලකමි.

සංඥා බලකායේ කාලීන සිදුවීම් වන පරිපාලනය, හඩ් කාර්යය සම්පාදනය, යටිතල පහසුකම් සංවර්ධනය, තාක්ෂණික සංවර්ධනය, ක්‍රීඩා කටයුතු සහ පැවරෙන සියළුම රාජකාරීන් වගකීමෙන් ඉටුකිරීමෙහිලා පැහැදිලි ප්‍රගමනයක් දක්නට ලැබීම සතුටට කරුණක් වන අතර, එවන් සියළු ක්‍රියාකාරකම් මධ්‍යයේ අඛණ්ඩව වසරක් පාසා මෙම සඟරාව එළිදැක්වීමෙන් නිර්මාණශීලි හැකියාවන් ඇති අයවළුන්ගේ කුසලතාවයන් වැඩි දියුණු කර ගැනීමට තෝතැන්නක් වෙමින් මහඟු කාර්යයක් ඉටුකරන ලද "ද සිග්නලර්" සඟරාව දිනෙන් දිනම දියුණුවට පත්වේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරන්නෙමි.

අවසන් වශයෙන් සංඥා බලකායේ සේවයේ නියුතුව සිට යුද්ධයේදී තම ජීවිතය පූජාකල අභීත රණවිරුන් හදපිරි භක්තියෙන් යුතුව සිහිපත් කරන අතර, තුවාල ලබා සිටින සියළු රණවිරුවන් හට ඉක්මන් සුවයත්, එම සියළුම අයවළුන්ගේ පවුල්වල අයටත්, දැනට සේවයෙන් විශ්‍රාම ගෙන සිටින ශ්‍රී ලංකා සංඥා බලකා සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල අයටත්, දැනට සේවයෙහි නිරතව සිටින සියලුම නිළධාරීන්/සෙසුනිළයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත්, නිරන්තරයෙන් අප හා එක්ව කටයුතු කරන සිවිල් සේවක කාර්ය මණ්ඩලයට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් සාමය සතුට සපිරි සෞභාග්‍යමත් සුභ අනාගතයක් උදෙසා සුභාශිංසන පුදකරමි.

ජේ ආර් පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී එන්ඩියු පීඑස්සී යූඑස්එසීපීඑස්සී
මේජර් ජෙනරාල්
සංඥා බලකාධිපති

## සංඥා බලසේනාධිපතිගේ පණිවුඩය



ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් පල කරනු ලබන "ද සිග්නලර්" සඟරාවේ 17 වන කලාපය වෙනුවෙන් සංඥා බලසේනාධිපති වශයෙන් විශේෂ පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද වරප්‍රසාදයක් මෙන්ම භාග්‍යයක් කොට සලකමි.

සංඥා බලකාය එහි වර්ධනයත් සමඟ යුධ පිටියේ සංඥා සම්බන්ධතාවය සැපයීමේ නවීනතම ක්‍රම උපායන්ට හා නව්‍යකරණයන්ට අනුකූලව වෘත්තීයමය හමුදාවක් ලෙස ඉදිරියට පා තබා ඇත. ඒ අනුව සංඥා සම්බන්ධතා සැපයීම වෙනුවෙන් අප ලබා ඇති නිපුණත්වය තවදුරටත් වර්ධනය කර වෙනස් වන ලෝකයත් සමඟ ඉදිරියට පිය නැඟීම අප කාගේත් පරම යුතුකම හා වගකීම වේ. මෙම අභිමතාර්ථය වෙත ළඟාවීමට අප සංඥා බලකාය හා බැදුණු ක්ෂේත්‍රයේ නිපුණ වෘත්තිකයින් ලෙස සේවය කිරීමට සියළුම අයවළුන් අදිටන් කරගත යුතු වේ.

ලෝකයෙහි තාක්ෂණික දියුණුවට සමගාමීව නවීන තාක්ෂණික උපකරණ පිළබඳව පර්යේෂණ කිරීමට හැකි හා එම උපකරණ නිපදවීමට හැකි තාක්ෂණික දැනුම අප බළකාය සතුව තිබීම අනාගත තාක්ෂණික විප්ලවයේ මංපෙත් විවර කරන අවියක්සේ සැලකිය හැක.

තොරතුරු සම්බන්ධතා තාක්ෂණය හරහා බුද්ධි තොරතුරු ලබාගැනිමට හැකිවීමෙන් ජාතික ආරක්ෂාවට දක්වන ඍජු දායකත්වය ඉතාමත් ඵලදායි සේවයක් වන අතර, මේ සඳහා සංඥා සම්බන්ධතා තාක්ෂණය නිවැරදිව සහ උසස් අන්දමින් ඉටු කිරීමට යොදාගනු ලබන තාක්ෂණික උපකරණ පිළිබඳ දැනුම සහ තාක්ෂණික සීමාවන් ඔබ විසින් අධ්‍යයනය කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකා සංඥා බලකා සාමාජික සාමාජිකාවන්ගේ තාක්ෂණික විෂයන් පිළිබඳ දැනුම ඉදිරියට ගෙනයාම සඳහා නිසි කාලපරිච්ජේදයක් උදාවී ඇත.

තවද මෙම සඟරාවෙහි සාර්ථක එළි දැක්වීම උදෙසා වෙහෙසී ක්‍රියාකල සංස්කාරක මණ්ඩලයටත් මෙම සඟරාව සඳහා නිර්මාණ සපයමින් විවිධාකාරයෙන් දායකවූ සියළු දෙනාටත් අවසාන වශයෙන් ශ්‍රී ලංකා සංඥා බලකායෙහි නිළධාරීන්ටත් සෙසුනිළයින්ටත් ඔවුන්ගේ පවුල්වල සැමටත් සිවිල් සේවක මහතුන් සහ ඔවුන්ගේ පවුල්වල සැමටත් සෞභාග්‍යය පිරි අනාගතයක් උදෙසා සුභාශිංසනය පුදකරමි.

එච් පී සෙනෙවිරත්න යූඑස්පී
බ්‍රිගේඩියර්
සංඥා බලසේනාධිපති



## අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණගේ පණිවුඩය



ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් පළකරනු ලබන "ද සිග්නලර්" සඟරාවේ 17 වන කලාපයට තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි. අප සියළු දෙනා විජයග්‍රාහී කීර්තිමත් යුධ හමුදාවක සාමාජිකයින් වන්නෙමු. තොරතුරු සන්නිවේදන තාක්ෂණවේදය තුළින් යුධ හමුදාව නව මගක් කරා ගමන් කරමින් සිටින අවස්ථාවක මෙම සඟරාව තුළින් සංඥා බලකායේ සියළු දෙනාට තම තාක්ෂණඥානය හුවමාරු කර ගැනීමට ලැබෙනු ඇති බව මාගේ විශ්වාසයයි.

අද වන විට අප අධ්‍යක්ෂ මණ්ඩලයට යුධ හමුදාවට අවශ්‍ය මෘදුකාංග යුද්ධ හමුදාව තුළම සංවර්ධනය කර ගැනීමට පසුගිය වසර කිහිපය තුළ හැකියාව ලැබීම අප ලද විශාල ජයග්‍රහණයක්සේ සලකමි. මෙම නිසා අප අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ නිළධාරීන්ගේ හා සෙසු නිළයන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කර ගැනීමට හැකියාවක් උදා වී ඇත.

තවද, මෙම සතුටුදායක මොහොතේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ඒ යටතේ සේවයේ නියුතු සියළුම නිළධාරීන් හා සෙසු නිළයින් යුධ හමුදාවේ මෘදුකාංග, දෘඩාංග අවශ්‍යතාවයන් සඳහා නිපුණ වෘත්තිකයින් ලෙස ඉටු කරනු ලබන සේවය වෙනුවෙන් මාගේ කෘතඥතාවය පිරිනමනු ලබන අතර ඔවුන්ගේ සියළු ඉදිරි කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.

අවසාන වශයෙන්, මෙවැනි අධ්‍යාපනිකමය වැදගත් සඟරාවක් එළිදැක්වීමට ඇප කැප වී කටයුතු කළ කර්තෘ මණ්ඩලය සඳහාද මාගේ ස්තුතිය පුද කරමි. එසේම මෙම සඟරාව අනාගතයේදීත් මේ ආකාරයටම සංඥා බලකායේ අයවළුන්ට සයිබර් හා විද්‍යුත් චුම්බක තරංග ක්ෂේත්‍රයේ සියළුම දැනුම හුවමාරු කිරීමට පිටුවහලක් වන බව නිසැකයි.

කේ එම් ආර් පී කරුණාතිලක පීඑස්සී
බ්‍රිගේඩියර්
තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ

The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015

# සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකගේ පණිවුඩය



"ද සිග්නලර්" සඟරාවෙහි 17 වන කලාපය එළිදක්වන 2015 වසරෙහි අඛණ්ඩව දෙවන වරටත් ඊට දායක වෙමින් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා හට මහත් වූ ගෞරවයක් සහ සතුටක් බැව් ප්‍රථමයෙන්ම සඳහන් කරනු කැමැත්තෙමි.

දශක තුනකට අධික කාලයක් මෙරට පැවති කුරිරු වූ ත්‍රස්තවාදය සහමුලින්ම රටින් තුරන් කර ගෞරවණීය සාමයක් බුක්තිවිඳින්නාවූ මෙම වකවානුවක සංඥා බලකාය බුද්ධිමය අත්තිවාරමක් මත තම අනාගත තාක්ෂණික ලෝකය ගොඩනංවන මෙම මොහොතෙහි පසුගිය වසරක කාලයක් සංඥා බලකා මාතාව පැමිණි ගමන් මග දෙස ආපසු හැරී බලන මෙම ප්‍රකාශණය එළිදැක්වීමට ලැබීම මහත්වූ අභිමානයක් බව සිහිපත් කරන්නට කැමැත්තෙමි.

රට තුල පැවති යුදමය වාතාවරණය අවසන් කිරීමෙන් පසු ශ්‍රී ලංකා සංඥා බලකාය රටේ සංවර්ධන ක්‍රියාවලියට තම උපරීම දායකත්වය ලබාදෙන අතරම වෘත්තීමය හමුදාවක් වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව උසස් මට්ටමකට ගෙන යාම සඳහා නවීන තොරතුරු තාක්ෂණයෙන් සන්නද්ධව නොනැවති ගමන් කරන බව මතක් කිරීමට කැමැත්තෙමි. එමෙන්ම සංඥා බලකාධිපති හා ප්‍රධාන සංඥා නිළධාරීතුමන්ගේ මඟ පෙන්වීම යටතේ සියලුම සංඥා ඒකක හා සංඥා පුහුණු පාසල, සංඥා මාතාවගේ නාමය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල ඉහළින්ම බැබළවීමට දක්වන අතිමහත් දායකත්වය ප්‍රශංසනීය වේ. ඒ වෙනුවෙන් මාගේ හදපිරි ප්‍රණාමය ඔබ ඒකකයන්හි හා පුහුණු පාසලෙහි නිළධාරීන් හා සියලු නිළයින් වෙත පුදකිරීම මාගේ යුතුකමක් කොට සලකමි. තවද, රටේ ඒකීයභාවය වෙනුවෙන් තම කාය දානය හා ප්‍රාණ දානය පරිත්‍යාග කල ශ්‍රී ලංකා සංඥා බලකායේ විරෝධාර රණවිරුවන්ට මාගේ ශිර්ෂ ප්‍රණාමය පුද කිරීමටද මා මෙය අවස්ථාවක් කර ගනිමි.

මෙම සඟරාව ඉතා සාර්ථකව එළිදැක්වීම උදෙසා කැපවී ක්‍රියාකල සංස්කාරක මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කර සිටින අතර, ශ්‍රී ලංකා සංඥා බලකායේ සියලුම නිළධාරීන් හටද සෙසුනිලයින්හට හා ඔවුන්ගේ පවුල්වල සැමටත්, සිවිල් සේවක මහතුන් සහ ඔවුන්ගේ පවුල්වල සැමටත් සෞභාග්‍යයෙන් පිරි සුභ අනාගතයක් උදෙසා සුභාශිංසන පුදකර සිටිමි. එමෙන්ම සංඥා බලකා සත්නාමය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල දිනෙන් දින බැබළේවායි ප්‍රාර්ථනා කර සිටිමි.

එන් පී අකුරන්තිලක
බ්‍රිගේඩියර්
රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක





## මහා බ්‍රිතාන්‍යය රාජකීය සංඥා බලකාය බිහිවීමට පෙර සංඥා ඉතිහාසය

යුධ බිමේ පණිවුඩ හුවමාරු කර ගැනීම සඳහා සංඥා භාවිතා කිරීමේ ඉතිහාසය සංග්‍රාම ඉතිහාසය තරම් ම වූ දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියයි. මහා බ්‍රිතාන්‍යය රාජකීය සංඥා බලකායේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ මහා බ්‍රිතාන්‍යය රාජකීය ඉංජිනේරු බලකායයි. එහි මුල් පුරුක ලෙස "රාජකීය ඉංජිනේරු සංඥා සේවාව" (Royal Engineers Signal Service) සැලකේ.

දහසය වන ශතවර්ෂයේදී පණිවුඩ හුවමාරුව සඳහා "බීකන්"(Beacon) භාවිතා කරන ලද අතර, 1796 දී "Murray Lettering Telegraph" නම් වූ යන්ත්‍රය සංඥා යැවීම සඳහා රාජකීය ඉංජිනේරු සංඥා සේවාවට හඳුන්වා දෙන ලදී. "මෝස්" පණිවුඩ යැවීම හා "ඉලෙක්ට්‍රික් ටෙලිග්‍රාෆ්" ක්‍රමය මුල් වරට භාවිතා කරන ලද්දේ "ක්‍රිමියන්" සංග්‍රාමයේදීය. (Crimean war , 1853 - 1856). පසුව 1867 දී "ඇබිසීනියන් සංග්‍රාමයෙන් (Abyssinian war ) පසු මුල් වරට රාජකීය ඉංජිනේරු බලකායට අනුයුක්තව "සංඥා අංශයක්" (Signal Wing) මහා බ්‍රිතාන්‍යයේ චැතම් (Chatham) හි දී පිහිටුවන ලදී.

1884 දී මුල්ම ටෙලිග්‍රාෆ් බලඇණිය රාජකීය ඉංජිනේරු බලකායට අනුයුක්තව "Telegraph Battalion Royal Engineers " ලෙස පිහිටුවන ලදී. එම බලඇණිය නයිල් සංග්‍රාමය (Nile Campaign) හා අශාන්ති සංග්‍රාමය (Ashanthi Campaign) යන යුද්ධ වලදී කැපීපෙනෙන සේවාවක් ඉටුකල බැව් බ්‍රිතාන්‍ය සංඥා ඉතිහාසයේ සඳහන් වේ.

සංඥා සම්බන්ධතා සඳහා වෙන්වූ බලකායක් පිහිටුවීමේ නිල එකඟතාවයකට මහා බ්‍රිතාන්‍ය රජය 1918 දී එළඹි අතර, එය පළමු ලෝක යුද්ධය අතරතුර පිහිටුවීමට ක්‍රියාකලද විවිධ වූ හේතූන් මත 1920 දක්වා එම අරමුණ සඵල කර ගැනීමට නොහැකි විය.

1920 ජූනි මස 28 වන දින "සංඥා බලකාය" පිහිටුවීම සඳහා වූ අක්තපත්‍රය, එවකට මහා බ්‍රිතාන්‍ය සංග්‍රාමික කටයුතු සඳහා වූ රාජ්‍ය ලේකම් ලෙස කටයුතු කල ගරු වින්ස්ටන් එස් චර්චිල් විසින් අත්සන් කරන ලදී. ඉන් සති හයකට පසු මහා බ්‍රිතාන්‍යය "රාජකීය සංඥා බලකාය" (Royal Corps of Signals) නමින් සංඥා බලකාය නිල වශයෙන් බිහිවිය.




1920 දී රාජකීය සංඥා බලකාය බිහිවීමත් සමඟ ආරෝහක පණිවුඩකරුවන්ගේ සේවය සංඥා හුවමාරුව සඳහා හඳුන්වාදෙන ලදී.

The Royal Corps of Signals වෙබ් අඩවිය ඇසුරිනි.



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015



හිටපු අග්‍රාමාත්‍ය ගරු රණසිංහ ප්‍රේමදාස මැතිඳුන් හට සංඥා බලකා නිළධාරීන් සහ සෙසු නිළයින් විසින් පිරිනැමුණු ආචාර පෙළපාලිය - 1980



හිටපු ජනාධිපති අතිගරු ජේආර් ජයවර්ධන මැතිඳුන් සංඥා උපකරණ ප්‍රදර්ශනය නැරඹීම සඳහා පැමිණීම - 1982



යුද හමුදා අන්තර් රෙජිමේන්තු හොකී ශූරතාවය දිනූ සංඥා බලකා හොකී කණ්ඩායම - 1980



යුද හමුදා අන්තර් රෙජිමේන්තු රගර් ශූරතාවය දිනූ සංඥා බලකා රගර් කණ්ඩායම - 1980





## ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය

වර්ෂ 1943 ඔක්තෝම්බර් මස 19 දින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා සංඥා බලකාය යුද්ධ හමුදාවේ ව්‍යාප්තියත් ක්‍රියාන්විත රාජකාරි කාර්යය භාරයත් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සන්නිවේදන සේවාවක් පවත්වා ගැනිම මූලික කරගෙන 2007.03.12 වන දින යුද්ධ හමුදා චර්යා නියෝග 44/2007 මගින් පනාගොඩ යුද්ධ හමුදා ජනපදය තුලදී ප්‍රධාන සංඥා නිළධාරී මුලස්ථානය ස්ථාපනය කරන ලදී.



ලුතිතන් කර්නල් බීඩබ්එම්ජේඑ ප්‍රේමදාස ආර්එස්පි ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් 2015.08.19 දින ප්‍රසංනිමු කර්නල් සම්බන්ධීකරණ තනතුරෙහි සුභ මොහොතින් වැඩ භාරගත් මොහොත

ප්‍රධාන සංඥා නිළධාරී මුලස්ථානය එහි ආරම්භයේ සිට ත්‍රස්තවාදයට එරෙහි මානුෂීය මෙහෙයුමෙහි සාර්ථක නිමාව දක්වා වූ තීරණාත්මක කාලය තුල යුද හමුදාවේ ද අනෙකුත් සේවාවල ද පොලිසියට ද සිවිල් ආරක්ෂක සේවාවට ද අවශ්‍ය පරිදි සන්නිවේදනය, තොරතුරු තාක්ෂණය හා විද්‍යුත් සංග්‍රාමික විෂයන්හි අනුශාසකත්වය, සම්බන්ධීකාරණය, පහසුකම් සැපයීම හා [illegible] සහ ක්‍රියාවලීයන්හි නිරත [illegible] විශිෂ්ට කාර්යභාරයක් ඉටුකරන ලද අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමක කොමිෂන් සභාව හා ඊට සම්බන්ධ සිවිල් ආයතන සමඟින්ද මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් ක්‍රියාකරන ලදි. වත්මන් ප්‍රධාන සංඥා නිළධාරී වශයෙන් මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පී යූඑස්පි එන්ඩියු පීඑස්සි යූඑස්එසීපීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී කටයුතු කරමින් සිටී.

මෙසේ ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බලකාය වඩාත් කාර්යක්ෂම හා වෘත්තීයමය බලකායක් ලෙස යුද්ධ හමුදාවේ මෙන්ම ජාතික අවශ්‍යතාවයන්හි ද නිරන්තරයෙන් නිරතව සිටින අතර, එහිදී ප්‍රධාන සංඥා නිළධාරී මුලස්ථානය එම කටයුතු සියල්ල පිළිබඳ විශේෂ දැක්මකින් යුතුව ඊට අදාල තාක්ෂණික ඥාණය හා ඉදිරි කටයුතු සම්පාදනයෙහිලා කැපවී ක්‍රියාකරනු ලබයි.

තවද ප්‍රධාන සංඥා නිළධාරීගේ පූර්ණ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් (පීඑල්සී) ආයතනය වෙතින් අධියර 7 ක් යටතේ තාක්ෂණික වැඩි දියුණු කිරීම් සඳහා ශ්‍රී ලංකා සංඥා බලකායේ කාර්මිකයින් 61 ක් යොදවා වසර 2 1/2 ක කාලයක් සාර්ථකව රාජකාරීන් සිදුකර යුධ හමුදාවට විශාල ප්‍රතිලාභයක් මෙන්ම කාර්මික දැනුමක් ලබාගැනීමට හැකිවිය. යුධ හමුදා දත්ත ජාලය සහ ස්වයංක්‍රීය දුරකථන හුවමාරු පද්ධති මේ වන විට අධියර 1 යටතේ (යුහමු, ආසේමු සහ සේමු) සියල්ලම හා අධියර 2 යටතේ රෙජිමේන්තු මධ්‍යස්ථාන ද සාර්ථකව ආවරණය කර ඇති අතර, 3 වන අධියර යටතේ පුහුණු මධ්‍යස්ථාන හා පුහුණු පාසල් ආවරණය කිරීම සඳහා මේ වන විට සැලසුම් සකස් කරමින් පවතී. එමෙන්ම ඒකක මට්ටම දක්වා රැහැන් දුරකථන සම්බන්ධතාවය ලබාදීම පිණිස ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මිලදී ගන්නා ලද දුරකථන හුවමාරු 340 ක් ආසේමු යටතේ ඇති සංඥා ඒකකයන් හරහා බෙදාහැරීම මෙම මූල අධීක්ෂණය යටතේ සිදුකර ඇත.

ලිපිද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා නව පරිගණක මෘදුකාංගයක් වශයෙන් දෛනික කාර්යාල ලිපි හුවමාරු සේවාව පසුගිය වසරේ මාර්තු මස වන විට සාර්ථකව නිමකර ගැනීමට හැකිවිය. පසුව යුධ හමුදාවේ නිළධාරීන් සහ සෙසුනිළයින් හට ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා පුහුණු වැඩසටහන් යුධ හමුදා මූලස්ථානය, ශාඛා, අධ්‍යක්ෂ මණ්ඩල, ආරක්ෂක සේනා මූලස්ථාන, සේනාංක මූලස්ථාන සහ රෙජිමේන්තු මධ්‍යස්ථාන මූලික කර ගනිමින් සිදුකරන ලදී. මෙහි මූල් අධියර ලෙස දැනට යුධ හමුදා දත්ත ජාලයෙහි සේවාව ලබාදී ඇති ස්ථාන අතර එය 2015.04.01 දින සිට ප්‍රායෝගිකව ක්‍රියාත්මක කර ඇත.

තවද 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි 6 ශ්‍රීලංසංබ ඒකකය තොරතුරු තාක්ෂණ ඒකකයක් වශයෙන්ද, සංඥා මූලික වැඩපල 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය වශයෙන් ද නැවත ස්ථාපිත කරන ලදී. එමෙන්ම යුද්ධ හමුදාවේ තොරතුරු සන්නිවේදනය ක්‍රමවත්ව ආරක්ෂාකර ගැනීම සඳහා 12 වන සංඥා බලකාය ලෙස සයිබර් ආරක්ෂක ඒකකයක් (Cyber Security Unit) නගා සිටුවීම සඳහා යුද්ධ හමුදාධිපති තුමාගේ අනුමැතිය ලබාගෙන ඇත.

ඒ සමඟම යුද හමුදා සාමාජිකයින්ගේ පවුල්වල දුදරුවන්ගේ පරිගණක දැනුම වෘත්තිය පුහුණු මට්ටමට ලබාදීම පිණිස ආරම්භ කර ඇති රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතන මේ වන විට පනාගොඩ, අනුරාධපුරය, මහනුවර යන නගරවල ස්ථාපිතව ඇති අතර, කුරුවිට හා කොකාවිල් ස්ථානවල පිහිටුවා ඇති පුහුණු ආයතන මගින් යුද හමුදාවේ සේවය කරන සාමාජික සාමාජිකාවන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම පිණිස කටයුතු කරයි. තවද මෙම ආයතනයන්හි පාඨමාලා හදාරනු ලබන සිසුන් සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු වීම් අධිකාරිය (NAITA) මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ වෘත්තීය පරීක්ෂණයන්ට පෙනී සිටීමේ අවස්ථාවද උදාකරදී ඇත. ලිපිකරු පාඨමාලාව හදාරා නික්මයන ලිපිකරුවන්/ලිපිකාරිනියන් උදෙසා පූර්ණ කාලීන මසක පුහුණු පාඨමාලාවන් කුරුවිට හා කොකාවිල් හි පිහිටි රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතන මගින් පවත්වනු ලබයි.







මොබිටෙල් ජංගම දුරකථන ජාලය තාක්ෂණික වැඩි දියුණු කිරීම වෙනුවෙන් සෙනින් සහභාගි කිරීම

## රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සංඥා බලකාය

72 වසරක ප්‍රෞඩ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකා සංඥා බලකාය වේගයෙන් දියුණු වන ලෝකයේ නව සන්නිවේදන හා තාක්ෂණයත් සමග උරෙන් උර ගැටී ඉදිරියටම යමින් පවතින මොහොතක රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පහත සඳහන් වෙනස්කම් සිදුවන ලදී.

වර්ෂ 2015 මැයි මස 06 දින හිටපු සංඥා බලකාධිපති වන මේජර් ජෙනරාල් එස් ඒ පි පි සමරසිංහ ආර්එස්පි යුඑස්පි පිඑස්සි යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ගැනිමත් සමග මේජර් ජෙනරාල් කේ ආර් පි රොවෙල් ආර්ඩබ්පි යුඑස්පි එන්ඩියු පිඑස්සි යුඑස්එසීපීඑස්සී 2015 මැයි මස 07 වන දින නව සංඥා බලකාධිපති වශයෙන් එම තනතුරේ වැඩ භාරගන්නා ලදී. එමෙන්ම සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක තනතුරේ රාජකාරී කළ කර්නල් එම් පි ජේ එස් ඒ පටබැඳිගේ 2015 ජනවාරි මස 25 දින එම තනතුර අත්හරින ලද අතර.

එදිනම කර්නල් පි ඒ ජේ පිරිස් එම තනතුර භාරගන්නා ලදී. රෙජිමේන්තු මධ්‍යස්ථානයේ විධායක අධිකාරි ලෙස කටයුතු කල මේජර් එච් ඒ ඩී ඩබ් හෙට්ටිආරච්චි 2014 දෙසැම්බර් මස 25 වන දින එම තනතුර අත්හරින ලද අතර. මේජර් ඩබ් ඒ ඊ එස් කරුණාරත්න එදිනම රෙජිමේන්තු මධ්‍යස්ථාන විධායක අධිකාරි තනතුර භාරගන්නා ලදී.

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රෙජිමේන්තු සැරයන් මේජර් තනතුරේ කටයුතු කල සෙ/276422 බනි 1 එස් නන්දලාල් යුඑස්පි 2015 අප්‍රේල් මස 05 වන දින විශ්‍රාම ගැනිම සඳහා එම ධුරය අත්හරින ලද අතර. සෙ/275704 බනි 1 කේ ඒ වානේවත්ත සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රෙජිමේන්තු සැරයන් මේජර් තනතුර 2015 අප්‍රේල් මස 06 වන දින භාරගන්නා ලදී. රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ප්‍රධාන සරඹ උපදේශක ලෙස කටයුතු කල සෙ/276039 බනි 11 ජයරත්න එස් එස් 2015 මාර්තු මස 11 වන දින එම තනතුර අත්හරින ලද අතර. සෙ/277098 බනි 11 මංජුල කුමාර ඒ එස් 2015 මාර්තු මස 12 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන ප්‍රධාන සරඹ උපදේශක තනතුර භාරගන්නා ලදී. රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ප්‍රධාන ලිපිකරු තනතුරේ කටයුතු කල සෙ/276524 බනි 1 එච් එම් බී ආර් ප්‍රේමලාල් 2015 අප්‍රේල් මස 05 වන දින එම තනතුර අත්හරින ලද අතර. සෙ/276461 බනි 1 එම් පී ජේ පෙරේරා සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ප්‍රධාන ලිපිකරු තනතුර 2015 අප්‍රේල් මස 06 වන දින භාර ගන්නා ලදී.



කර්නල් පීඒජේ පීරිස් ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් 2015.01.25 දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක තනතුරේ සුභ මොහොතින් වැඩ භාරගත් මොහොත

එකක ප්‍රතිසංවිධානය වීම යටතේ සංඥා මූලික වැඩපල 10 ශ්‍රීලංසංබ (සන්නිවේදන තාක්ෂණ) ඒකකය ලෙසට පරිවර්තනය වීම සංඥා බලකාය ලැබූ විශාල ජයග්‍රහණයක් ලෙස දැක්විය හැකියි.

71 වන සංවත්සරයට සමගාමීව හිටපු යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර් එම් ඩී රත්නායක ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී එන්ඩියු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් ප්‍රධාන දොරටුව හා රණවිරු ස්මාරකය සුභ මොහොතින් විවෘත කිරිම සිදුකරන ලද අතර සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ඉදිකරමින් පැවති 10 ශ්‍රීලංසංබ ඒකක ගොඩනැගිල්ල, නිළධාරී නිවස්න නව ගොඩනැගිල්ල, බනි/සැරයන් නිවස්න ගොඩනැගිල්ල, ශ්‍රවණාගාරය, ප්‍රධාන දේශණ ශාලාව හා ජන අවන්හල ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු නිම කර ඊට සමගාමීව විවෘත කරන ලදී.

එම ඉදිකිරීම් කටයුතු වල දෙවන අධියර ලෙස නිළධාරී නිවස්නයේ නව ගොඩනැගිල්ලක් මේ වන විට ඉදිකර ඇති අතර සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රය ඉදිරිපිට පුරන් කුඹුරු අස්වැද්දීමේ ව්‍යාපෘතියක් ද ආරම්භ කිරීමට කටයුතු සංවිධානය කර ඇත. එමෙන්ම මෙම රෙජිමේන්තු පරිශ්‍රයේ වූ සියලු සෙබලුන්ගේ ගැටලුවක්ව පැවති ජල හිඟතාවය මේ වන විට නිරාකරණය කර ඇත.

තවද සංඥා බලකාධිපති තුමන්ගේ අදහසකට අනුව සංඥා බලකායේ සියලුම නිළධාරීන්ගේ සුභසාධනය සඳහා සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙතින් පවත්වාගෙන යනු ලබන සංඥා නිළධාරී යහසාධක අරමුදලින් ලබාදෙන ණය මුදල රු 400,000.00 සිට රු 500,000.00 දක්වා ද, නිළධාරී මංගල උත්සවයකදී ලබාදෙන රු 100,000.00 ක ත්‍යාග මුදලට අමතරව තවත් රු 100,000.00 ක් වටිනා ත්‍යාග වවුචරයක් පිරිනැමීමට ද 2015 ජූලි මස 08 වන දින පැවති මන්ත්‍රණ සභාවේදී තීරණය කරන ලදී.



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015



රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නව කායවර්ධන මධ්‍යස්ථානය විවෘත කිරීම



රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නව ආපනශාලාව විවෘත කිරීම



සංඥා බලකාධිපති තනතුර භාරදීම් / භාරගැනීම් සිදුකල ඓතිහාසික මොහොත



හිටපු යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ සංඥා බලකාධිපති තුමන්ගේ විශ්‍රාම ගැනීමේ නිළධාරී නිවස්න සාදයට සහභාගී වූ ජ්‍යෙෂ්ඨ නිළධාරීන්



හිටපු යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ සංඥා බලකාධිපති තුමන් යුද හමුදාවෙන් සමුගැනීමේ අවස්ථාව...



නව සංඥා බලකාධිපති තුමන් වෙත පිරිනැමූ සම්මාන මුරය



හිටපු යුද්ධ හමුදාපති ලුතිතන් ජෙනරාල් ආර් එම් ඩී රත්නායක ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් රණවිරු ස්මාරකය සුභ මොහොතින් විවෘත කිරීම





## සංඥා බලසේනා මුලස්ථානය

පිරිපුන් මවුබිමක් - අභිමන් හෙට දිනක් යන්න තේමාව කරගත් 67 වන ජාතික නිදහස් සැමරුම් උළෙල මෙවරද බත්තරමුල්ල ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තු ක්‍රීඩාංගනයේදිත් වසර 30 ක් පුරා පැවති ත්‍රස්ථවාදය නිමා කිරීමෙන් පසු පැවති එහි විජයග්‍රහණ සැමරුම නිමිති කොට ගෙන 06 වන වරටත් මාතර නගරයේ පවත්වන ලද ජාතික රණවිරු සැමරුම් දින පෙළපාලිය සඳහා අවශ්‍ය සංඥා සම්බන්ධතාවයන් මෙම බලසේනා මුලස්ථාන පූර්ණ අධීක්ෂණය මත ලබාදීමට හැකි විය.



සංඥා බලසේනා මූලස්ථානයේ නව බලසේනාධිපති ලෙස බ්‍රිගේඩියර් එච්පී සෙනවිරත්න යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිළධාරී සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාරගත් මොහොත

කුරිරු ත්‍රස්ථවාදය ලක් දෙරණින් තුරන් කල පසු වර්ෂයක් පාසා පවත්වනු ලබන දියකාවා යුධ අභ්‍යාසය 05 වන වරටත් විදේශීය හමුදාවන්ගේ සහභාගිත්වයෙන් යුතුව ඒකාබද්ධ යුධ අභ්‍යාසයක් ලෙස සාර්ථකව නිමකර ගැනිමට අවැසි සංඥා සම්බන්ධතාවයන් මෙම මුලස්ථාන මඟපෙන්වීම යටතේ සාර්ථකව ලබාදෙන ලදී.

දේශීය හා විදේශීය රටවල ආරක්ෂක ප්‍රධානින් සහ ප්‍රභූවරුන්ගේ සහභාගිත්වයෙන් කොළඹ මවුන්ට් ලැවිනියා හෝටලයේදී 2015.06.05 වන දින සිට 2015.06.09 වන දින දක්වා පැවති ආරක්ෂක සම්මන්ත්‍රණය සඳහා පැමිණි විදේශීය හා මෙරට ආරක්ෂක ප්‍රධානින්ගේ සම්මන්ත්‍රණයට සමගාමීව රජය විසින් සංවිධානය කරනු ලැබූ විවිධ රාජ්‍ය උත්සවයන්හි ආරක්ෂක හා පාලන කටයුතු සාර්ථක කරගැනිමට මහත් සේ ඉවහල් වූ සංඥා සම්බන්ධතාවයන් මෙම බලසේනා මුලස්ථානයේ මඟපෙන්වීම යටතේ ලබාදෙන ලදී.



2015.04.25 දින නේපාලයේ ඇතිවූ භූචලනයෙන් විපතට පත්වූවන්ට සහන සැලසීම සඳහා අවැසි සංඥා සම්බන්ධතාවයන් සැපයීම

2015.04.25 දින ආසියානු කලාපයේ නේපාල රාජ්‍යයේ ඇතිවූ ප්‍රබල භූචලනය හේතුවෙන් එහි විපතට පත් ජනතාවට සහන සැලසීම සඳහා ශ්‍රී ලංකා රජයේ මැදිහත්වීමෙන් ආපදා සහන සැපයීමේ කණ්ඩායම් සඳහා අවැසි සංඥා සම්බන්ධතාවයන් ලබාදීම මෙම බලසේනා මූලස්ථානයේ පූර්ණ අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ ඉතා උසස් අන්දමින් ඉටුකරන ලදී.



සංඥා බලසේනා මූලස්ථානයේ නව බලසේනා මේජර් ලෙස මේජර් එම්එච්එස්එස් මුතුගොඩ යන ජ්‍යෙෂ්ඨ නිළධාරී 2015.08.21 දින නව තනතුරේ වැඩ භාරගත් මොහොත



05 වන වරටත් විදේශීය හමුදාවන්ගේ සහභාගීත්වයෙන් යුතුව සිදුකරනු ලැබූ දියකාවා යුධ අභ්‍යාසයේ ක්‍රියාන්විත මැදිරිය



## තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රී ලංකා යුධ හමුදාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණය දියුණු කිරීමේ අරමුණ පෙරදැරිව තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය නමින් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය 2010.03.01 වන දින ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය යටතේ මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපිත කරන ලදි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් බ්‍රිගේඩියර් එස් එම් ආර් පී කරුණාතිලක පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමා රාජකාරී කරනු ලැබේ.

යුධ හමුදාපති තුමාගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ ශ්‍රී ලංකා යුධ හමුදාවේ අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය මෘදුකාංග සංවර්ධනය සඳහා ජාල පහසුකම් ලබා දීම සඳහා සැළසුම් කිරීම, සංවිධානය කිරීම නිර්මාණය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරනු ලැබයි. මේ සඳහා වර්තමනයෙහි මෙම අධ්‍යක්ෂ මණ්ඩලය අධීක්ෂණය යටතේ මෘදුකාංග ඉංජිනේරු කණ්ඩායමක් සහිත මෘදුකාංග සංවර්ධන අංශය (Software Development Wing), ජාල මෙහෙයුම් මධ්‍යස්ථානයක් (Network Operation Center), දත්ත මධ්‍යස්ථානයක් (Data Center), සහ වෙබ් අඩවි මධ්‍යස්ථානයක්ද (Web Cell) විධිමත්ව පවත්වාගෙන යනු ලැබේ.

මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෘත්තීයමය සුදුසුකම්ලත් නිළධාරීන්, මෘදුකාංග ඉංජිනේරු, සහකාර මෘදුකාංග ඉංජිනේරු, ජාල ඉංජිනේරු, තනතුරු සඳහා දෙවන ලුතිනන්, ලුතිනන් සහ කපිතන් නිළයන්ගෙන් බඳවා ගන්නා ලදි. ශ්‍රී ලංකා යුධ හමුදාවේ තොරතුරු සන්නිවේදන අවශ්‍යතාවයන් සඳහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ මග පෙන්වීම යටතේ ඉහත නිළධාරීන් මෙම කටයුතු සඳහා වැඩදායී ලෙස යෙදවීමට හා ඔවුන්ගේ දැනුම තුලින් ඵලදායී සේවාවක් ලබා දීමට මෙම අධ්‍යක්ෂ මණ්ඩලයට හැකිවී ඇත.

වර්තමානය වන විට ශ්‍රී ලංකා යුධ හමුදාවේ විවිධාකාර තොරතුරු සන්නිවේදන ව්‍යාපෘති හා රාජකාරී සඳහා තොරතුරු තාක්ෂණ නිළධාරීන් 71ක්, පරීක්ෂණක ක්‍රියාකරුවන් 651 දෙනෙක් 11 වන සංඥා බලකාය යටතේ රාජකාරී කරනු ලැබේ. එසේම එම සියලුම සංවර්ධන කටයුතු අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණය යටතේ මග පෙන්වීම හා අධීක්ෂණය තුලින් සාර්ථකව ඉදිරි ගමන කරා යොමු වෙමින් පවතී. මෙම වසර ආරම්භයේ දී 06 වන සංඥා රෙජිමේන්තුව, තොරතුරු සංඥා රෙජිමේන්තුවක් ලෙස ප්‍රතිව්‍යුහගත කර තොරතුරු තාක්ෂණික රාජකාරීන් සඳහා අනුයුක්ත කරන ලදි.

අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ හා තොරතුරු තාක්ෂණ උපදේශක තුමන්ලාගේ අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ විශාල ව්‍යාපෘතීන් රැසක් සාර්ථකව නිම කර ඇති අතර තවත් ව්‍යාපෘතීන් රැසක් සිදුකරගෙන යමින් පවතී. අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණයගේ හා අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ මග පෙන්වීම හා සක්‍රිය දායකත්වය මත පසුගිය වසර කිහිපය තුල ව්‍යාපෘතීන් රැසක් නිම කර සාර්ථකව යුධ හමුදාවේ කටයුතු සඳහා ලබා දීම යුධ හමුදාපති තුමාගේ ඇගයීමට හා ප්‍රශංසාවට ලක්වීමට හැකිවීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ලබා ගත් ජයග්‍රහණයකි. වර්තමානයේ මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් විවිධ ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත. උදාහරණ වශයෙන් අවි නිදර්ශකය (Weapon Simulators) සහ මෘදුකාංග ගත රේඩියෝ තාක්ෂණය (Software Defined Radio) ව්‍යාපෘති.

මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදුකරමින් පවතින ව්‍යාපෘතීන්:

- Daily Mail Dispatch Service
- Personal Administration System for Rehabilitation Centers
- Civil Information Management System
- Physical Test Monitoring System
- Information Management System for Dte of IHL and HR
- Strategic Database for Indep Dte Phase 11
- Officers Career Development Management System / Non Commissioned Officers Career Development Management System
- Integrated Intelligence and Information Management System Phase II
- Student Information Management System for SERRIC
- Patient Information Management System Phese IV
- E - Procurement Management System

වර්ථමානයේදී ශ්‍රී ලංකා යුද හමුදාව තොරතුරු තාක්‍ෂණයෙන් සන්නද්ධ යුද හමුදාවක් කරා පරිවර්ථනය වෙමින් පවතින අතර එම අනාගතය අභියෝග වලට මුහුණ දීම සඳහා සයිබර් ආරක්‍ෂක අංශයක් (Cyber Security Wing) ආරම්භ කිරීමට කටයුතු කරන ලදි.



කොළඹ විශාකා විද්‍යාලයේ පැවති InfoV ප්‍රදර්ශනයේදී අවි නිදර්ශකය නැරඹීම සඳහා පාසල් සිසුන් සහභාගී වී සිටි අයුරු.



2014.10.18 වන දින නවතමයෙන් ඉදිකරන ලද මෘදුකාංග සංවර්ධන සහ ඉංජිනේරු අංශය විවෘත කිරීම.



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015

## 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය වසර 71 කට අධික ඉතිහාසයකට හිමිකම් කියනු ලැබේ. එය සංඥා බළකායේ ඒකක කියල්ලෙහිම මව් ඒකකය වීම මහත් ආඩම්බරයකි.

1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ ඉතිහාසය යටත් විජිත යුගය දක්වා දිවෙන බව අනාවරණය විය. අතීතය හෙළිදරව් කරන අන්දමට ප්‍රථම සංඥා හඩ බ්‍රිටිෂ් රාජකීය ඉංජිනේරු බලකායෙන් පැඩි ආ නිළධාරීන් දෙදෙනෙකුගෙන්ද සෙසුනිළයන් 25 දෙනෙකුගෙන්ද යුක්ත විය.

2 වන ලෝක යුද්ධය තීව්‍ර වීමත් සමඟ බ්‍රිතාන්‍ය හමුදාවේ අවශ්‍යතා විවිධ අංශයන්ගෙන් වර්ධනය වූ අතර 1939 වසරේ සැප්තැම්බර් මාසයේදී බ්‍රිතාන්‍ය රාජකීය හමුදාවේ ක්‍රියාන්විත අවශ්‍යතා සැපයීම් පිණිස සහ මිත්‍ර පාර්ශවික හමුදාවන්ගේ සංඥා සම්බන්ධතා අවශ්‍යතා සැපයීම සඳහා සංඥා බලසෙණ සක්‍රීය සේවයට කැඳවන ලදි. එය බ්‍රිතාන්‍ය රාජකීය හමුදාවේ ස්වේච්ඡා නිළධාරීන් 04 දෙනෙකුගෙන් හා සෙසුනිළයින් විශාල සංඛ්‍යාවකින් සමන්විත විය. පහත නම් සඳහන් නිළධාරීන්ගෙන් එම බලසෙණය සමන්විත . වූ අතර ඔවුන් විසින් හොබවන ලද තනතුරු ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇත.

කපිතාන් පීඑච් ටොඩ් - බලසෙනාධිපති
දෙවන ලුතිතන් වීබී ප්‍රනාන්දු - අංශභාර නිළධාරී
දෙවන ලුතිතන් එච්ඩබ් වුඩ් - අංශභාර නිළධාරී
දෙවන ලුතිනන් ඒබී ස්කොබ් - අංශභාර නිළධාරී

සක්‍රීය ක්‍රියාන්විත රාජකාරී සිදුකිරීම සාම කාලයේදී සංඥා සම්බන්ධතා සැපයීමේ රාජකාරී වලින් වෙනස් වුවද රෙජිමේන්තුවේ අණදීම් අනුපිළිවෙල වෙනස් නොවූ අතර එය රාජකීය යුධ හමුදාවේ ඉංජිනේරු රෙජිමේන්තුව යටතේ තබන ලදී. මින් පසුව එලඹි දෙවන වසර තුල රාජකීය යුධ හමුදාවේ විකාශණයට සමගාමීව සංඥා බලසෙණයද පුළුල් කිරීමේ අවශ්‍යතාවය පැන .නඟින ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1941 වසරේදී තවත් අමතර බලසෙණය ක් ස්ථාපිත කරන ලද. අතර එය 4 වන ඉංජිනේරු බලසෙණය නමින් නම් කරන ලදී. මෙම දෙවන බලසෙණයට ලුතිතන් එච්ඩබ් වුඩ් විසින් අණදෙන ලදී. මෙම පුළුල් කිරීමේ කටයුත්ත රාජකීය යුධ හමුදවට සෙසුනිළයින් ලෙස බඳවාගත් ස්වදේශිකයන් නිළධාරීන් බවට පත්කිරීමට අවධාරණය කර සිටින ලදී. මෙලෙස සැරයන් සිල්වා සීආර්, සැරයන් ඇන්ඩ්‍රිස් එච්ජේ , සැරයන් සරීම් ඒටී සහ සැරයන් බ්‍රෝහියර් වී අධිකාරීයට පත් කරන ලදී.

1943 ඔක්තෝම්බර් මස 19 වන දින අංක 9183 ගැසට් පත්‍රය මඟින් 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය "සිලෝන් සිග්නල් බලකාය" නමින් පිහිටුවන ලදී. සිලෝන් හමුදාවේ දෙවන ප්‍රධාන රෙජිමේන්තුව



2015.02.14 දින නව ඒකක අණදෙන නිළධාරී වශයෙන් ලුතිතන් කර්නල් සීපී අරංගල්ල පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරී වැඩ භාර ගැනීම



2015 අප්‍රේල් 28 දින එවකට යුධ හමුදා මාණ්ඩලික ප්‍රධානි/ සංඥා බලකාධිපතිගේ ඒකක සංචාරය

ලෙස මෙය ස්ථාපනය කරන ලද අතර එය සිලෝන් ඉංජිනේරු රෙජිමේන්තුවට පසුව ස්ථානගත කරන ලදී.

ඉන්පසු අනුපිළිවෙළින් මේජර් සීආර් ද සිල්වා සහ මේජර් වීඑම් ප්‍රනාන්දු යන නිළධාරීන්ගේ අණදීම යටතේ බලඝණයන් දෙකක් පිහිටුවන ලදී.

ලුතිතන් ඩීවී බ්‍රොහියර් සිලෝන් සිග්නල් බලකායේ ප්‍රථම විධායක අධිකාරීවීමේ ගෞරවය හිමිකරගන්නා ලදි. දෙවන ලෝක යුද්ධය එහි උච්චතම අවස්ථාවට ළඟාවීම හේතුකොට ගෙන මේජර් වීසී කෙලට් සහ මේජර් එච්ඩබ්පී කූපර් යන නිළධාරීන්ගේ අණදීම් යටතේ තවත් බලඝන දෙකක් මහනුවර සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශයන්හි අනුපිළිවෙළින් ස්ථාන ගත කරන ලදි.

1944 වර්ෂය අවසාන වන විට රාජකීය සංඥා බලකාය ශ්‍රී ලංකාවෙන් ඉවත්ව යෑම නිසා සිලෝන් සිග්නල් බලකායේ අණදීමට නිළධාරී හිඟතාවක් ඇතිවිය. මෙහිදි රාජකීය සංඥා බලකායේ ලාංජනය එහි ආරම්භයේ සිට පැවති අලියෙකුගේ සලකුණින් ඔටුන්නක සලකුණ දක්වා වෙනස් විය. 1947 දි සිලෝන් ආරක්‍ෂක බලකාය රටෙහි අභ්‍යන්තර ආරක්‍ෂක අවශ්‍යතා සපුරාලනු වස් ශක්තිමත් කරන ලදි.



අණදෙන නිළධාරී විසින් නව සෙසුනිළ හඨ නිවාසයට මුල්ගල තැබීම හා එහි ඉදිකිරීම් කටයුතු නිරීක්‍ෂණය කිරීම



ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගත් දුරකථන හුවමාරු ඒකකයන්හි ස්ථාපනය කිරීම







ඒකකය තුල නවතමයෙන් ඉදිකරනු ලබන බේකරිය



නිළධාරී නිවස්නයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම

මේ සමගම ස්වේච්ඡා සංඥා බලඝණයෙහි අණදෙන නිළධාරී ලෙස මේජර් වීසී කෙලට් දෙවන අණදෙන නිළධාරී ලෙස මේජර් සීආර් ද සිල්වා සහ විධායක අධිකාරී ලෙස කපිතන් ඩීවී බ්‍රොහියර් කටයුතු කරමින් ප්‍රතිසංවිධානය කරන ලදි.

සමස්ථ ශ්‍රීලංකාවම බටහිර අධිරාජ්‍යයෙන් සම්පූර්ණ නිදහස ලැබීමෙන් පසු 1949 ඔක්තෝම්බර් 10 වන දින සිලෝන් යුධ හමුදාව පිහිටු වන ලද අතර. මෙයට සංඥා සඳහා සැපයීම පිණිස නිත්‍ය සංඥා ඛණ්ඩයක් පිහිටුවන ලදී. මෙය ශ්‍රීලංකා සංඥා බලකායෙහි වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන ලද අතර. ලුතිතන් එන්ටී ජොබ්ස් එහි අණදීම සිදු කරන ලදී. 1951 වසරේදී ශ්‍රීලංකා යුධ හමුදාවේ සිලෝන් සංඥා හඨ පිරිස් වෙත රාජකිය සංඥා බලකායේ සිරස්ක ලාංජනය පැළඳීමටද රාජකිය සංඥා බලකා ධජ වර්ණ සහ "බී ගෝන් ඩල් කෙයාර්" සංගීත වාදන කොටස ඔවුන්ගේ උත්සව අවශ්‍යතාවන් සඳහා භාවිතා කිරීමට ද අනුමැතිය ලබා දෙන ලදි. සිලෝන් යුධ හමුදාවෙහි ව්‍යාප්තියත් සමඟ නිත්‍ය සංඥා ඛණ්ඩ පිහිටුවීම තවත් පියවරක් ලෙස ඉදිරියට තබමින් බලඝණයක් ලෙස 1952 වසරේදි මේජර් ඩීවී බ්‍රොහියර්ගේ අණදීම යටතේ මූලස්ථාන අංශය සහ ක්ෂේත්‍ර හා බළකොටු අංශය ලෙස අංශ දෙකක් පිහිටුවන ලදී. එහි හඨ පිරිස් දියතලාව සංඥා මධ්‍යස්ථානයෙහි සහ යුධ හමුදා මූලස්ථාන යෙහි ස්ථාන ගත කරන ලදී. වසර 1953 සිට 1959 දක්වා කාලය තුළ සිලෝන් යුධ හමුදාවට කැරළි මර්ධනය කිරීමට සහ නිතර ඇති වන ස්වාභාවික විපත්වලින් අසරණ වූ මහජනයා ගලවා ගනු පිණිස රජය ගත් උත්සහයන්ට ආධාර වනු පිණිස සිය ආරක්‍ෂක විධිවිධාන තර කිරීමට සිදුවිය. වසර 1953 සිට 1959 දක්වා වූ කාලය සිලෝන් සංඥා බලකායෙහි නිත්‍ය සහ ස්වේච්ඡා බලඝණ දෙකටම ඉතා වැදගත් කාල වකවානුවක් විය. ස්වේච්ඡා හඨ පිරිස් හදිසි පහරදීම්, බාධක, හදිසි අවශ්‍යතා සහ 1958 දි ඇති වූ ජන වාර්ගික අර්බුදය වැනි කරුණු හේතු කොට ගෙන සේවය සඳහා කැඳවන ලදි. මෙය ඉටුකිරීමට ශ්‍රී ලංකා යුධ හමුදාවේ 1958 ඔක්තෝම්බර් 14 වන දින පළවන සංඥා බලකාය ස්ථාපනය කරන



නවතමයෙන් ඉදිකරනු ලබන මකර තොරණ



2015 වර්ෂය වෙනුවෙන් ආසේමු(මු) වෙතින් සංවිධානය කරනු ලැබූ වෙසක් කලාපය සඳහා ඉදිරිපත් කරන ලද "මුචලින්ද නාග දමනය" සහ පොසොන් කලාපය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ආදර්ශමත් "බුදු මැදුරක්" නිර්මාණය කිරීම

ලදී. එවකට එහි පළමු අණදෙන නිළධාරී ලෙස ලුතිතන් කර්නල් ඩීවී බ්‍රෝහියර් කටයුතු කළ අතර, ඊට අමතරව ඔහු ප්‍රධාන සංඥා නිළධාරී ලෙස ද කටයුතු කරන ලදී.

බල ඇණියේ මූලස්ථානය පනාගොඩ යුධ හමුදා පරිශ්‍රයේදී ඉදිකරන ලදී. මේජර් එම්ජේඑෆ් ආර් පෙරේරා එහි ප්‍රථම දෙවන අණදෙන නිළධාරී හා මූලස්ථාන බලසෙණාධිපති ලෙස කටයුතු කරන ලදී. කපිතන් එල්ජේඅයි ප්‍රනාන්දු පළමු බලසෙණයෙහි බලසෙණාධිපති ලෙස පත්වීම් ලද අතර, පළමු විධායක අධිකාරී වූයේ කපිතන් එඑම්එම් ෆර්ඩි නිළධාරී තුමන්ය. බළලත් නිළධාරී 1 පීපජ ද සිල්වා පළමු රෙජිමේන්තු සැරයන් මේජර් විය.

1962 ජනවාරි මාසයේදී ඇති වූ වැඩ වර්ජනය නිසා සංඥා රෙජිමේන්තුව දිවයිනේ රේඩියෝ පද්ධතියෙහි තරංග සම්ප්‍රේෂණ, ලබා ගැනිම, නැවත පිහිටුවීම සහ නොකඩවා කරගෙන යෑම පිණිස රාජකාරියේ යොදවන ලදී. මෙහිදී ඒකකය විසින් සුවිශේෂ වූ කාර්‍යභාරයක් රාජකිය සිලෝන් නාවික හමුදාව සහ රාජකිය සිලෝන් ගුවන් හමුදාව හා එක්ව ඉටු කරන ලදී.

1962 වසරේදී ලුතිතන් කර්නල් ඩීවී බ්‍රෝහියර් සිය ධූරය අතහරින ලද අතර, ඉන් අනතුරුව ලුතිතන් කර්නල් සීටී කල්දේරා රෙජිමේන්තුවේ අණදිම භාර ගන්නා ලදී.

1966 වසරේදී ලුතිතන් කර්නල් සීඑෆ් ප්‍රනාන්දු විසින් ලුතිතන් කර්නල් සීටී කල්දේරා නිළධාරීගෙන් රෙජිමේන්තුවේ අණදිම භාරගන්නා ලදී. 1967 වසරේදී ඔහු විසින් රෙජිමේන්තුවේ අණදිම ලුතිතන් කර්නල් එල්ජේඅයි ප්‍රනාන්දු වෙත භාරදෙන ලදී. 1971 වසරේදී රටේ ඇති වුණු කැරැල්ල සංඥා බලකායේ කැපී පෙනෙන වෙනසක් සිදු කරන ලදී. මන්දයත් හමුදාවේ සිදුවූ සීඝ්‍ර වර්ධනයත් සංඥා බලකායට විශේෂිත ක්‍රියාන්විත සඳහා නිරන්තරයෙන් ඇති වූ සංඥා සබඳතා අවශ්‍යයතාවයන් සැපයීමට සිදුවීමත් නිසාවෙනි.

ලුතිතන් කර්නල් ඩබ්ජේවීකේ ප්‍රනාන්දු 1972 වසරේ දී රෙජිමේන්තුවේ අණදිම භාරගන්නා ලදී. 1970 වර්ෂය අග භාගය වනවිට රෙජිමේන්තුව එහි තාක්‍ෂණික අතින් දියුණුවක් පෙන්වමින් රුහැන් 300 ක ස්වයංක්‍රිය හුවමාරුවක් යුධ හමුදා මූලස්ථානයේ ස්ථාපනය කරන ලදී. රෙජිමේන්තු මූලස්ථානය පනාගොඩ පිහිටි නව දෙමහල් ගොඩනැගිල්ලකට ගෙන යන ලදී. ලුතිතන් කර්නල් ඩීසිඩබ් කුරුප්පු නිළධාරී විසින් 1978 වසරේදී 1 ශ්‍රිලංසංබ අණදිම භාර ගන්නා ලදී. මේජර් සීජේ අබේරත්න 1979 වසරේදී එහි අණදිම භාරගත් අතර 1981 වසරේදී ඔහු ලුතිතන් කර්නල් නිළයට උසස් කරන ලදී.

1989 වසර වන තුරු 1 වන රෙජිමේන්තුව ශ්‍රිලංකා සංඥා



මාසිකව පවත්වන ලද ඒකක සෙසුනිළ සුහද හමුව



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015

බලකායට ක්‍රියාන්විත සහ පාලනමය කටයුතු වලදී මිනිසා විසින් සිදුකරන ලද ව්‍යවසනයන් වලදී මෙන්ම ස්වභාව ධර්මයා විසින් සිදුකරන ලද ව්‍යවසනයන් වලදි ද සමස්ථ ශ්‍රිලංකා යුද හමුදාවම ආවරණය වන පරිදි සංඥා සබඳතා සැපයීමේ භාග්‍යය අත්විය.

එවකට රටෙහි ඇතිවූ යම් යම් සිද්ධීන් සහ එහි වර්ධනයන් නිසා බලඇණිය නැවතත් මින්නේරිය මහසෙන්පුර ප්‍රදේශයෙහි 1996 දෙසැම්බර් 31 වන දින ප්‍රතිස්ථාපනය කරන ලදී. මෙහිදී ඉහතින් සඳහන් කල කාර්‍යයන්ට අමතරව 22 සේනාංකය යටතේ වූ ත්‍රිකුණාමලය ප්‍රදේශයෙහි සංඥා සබඳතාවය සැපයීම මෙම රෙජිමේන්තුවට පැවරිණි. බලකා ඉතිහාසයේ ප්‍රථම වරට 22 සහ 23 යන සේනාංක වෙත සංඥා සම්බන්ධතා සැපයීමේ වගකීම 1 ශ්‍රිලංසංබ වෙත පැවරීනි. මෙම ස්ථානයේ ප්‍රතිස්ථාපනය කිරීමෙන් අනතුරුව අණදෙන නිළධාරීවරුන් 07 දෙනෙකු යටතේ ඉහත සඳහන් කල සේනාංක 2 ට සහ ආරක්‍ෂක සේනා මූලස්ථානය නැගෙනහිර වෙත සංඥා සම්බන්ධතාවය සපයන ලදී. මෙම අණදෙන නිළධාරීවරුන් වනුයේ ලුතිතන් කර්නල් ආර්ඒ කඩුවෙල, ලුතිතන් කර්නල් ආර්වීඑ ඇඹුල්දෙනිය, ලුතිතන් කර්නල් ආර්එඑස් රණසිංහ, ලුතිතන් කර්නල් ඩී ඒකනායක, ලුතිතන් කර්නල් එම්ඩී වෛද්‍යරත්න සහ ලුතිතන් . කර්නල් ඩබ්පීඑකේ තිලකරත්න පීඑස්සී ය.

මින්නේරිය ප්‍රදේශයෙහි සිට වසර 12 ක සේවාවක් සිදුකරන අතරතුර, බලඇණිය මාවිල්ආරු මානුෂීය මෙහෙයුම හා නැගෙනහිර පළාත සම්පූර්ණයෙන්ම කොටි ත්‍රස්ථවාදයෙන් මුදවාගන්නා තෙක් ඒ සඳහා ඇවැසි වූ සංඥා සම්බන්ධතාවයන් සපයන ලදී. 2008 නොවැම්බර් 15 දින ඒකකය ආරක්‍ෂක සේනා මූලස්ථානය නැගෙනහිර ප්‍රදේශයෙහි ලුතිතන් කර්නල් පීඑජේ පීරිස් නිළධාරීතුමන්ගේ අණදිම යටතේ ස්ථාපනය කරන ලදී. මෙම කාලයේදී 1 ශ්‍රිලංසංබ ඒකකය වෙත වැලිඔය උතුරු ප්‍රදේශයෙහි ක්‍රියාන්විතයන් හි යෙදී සිටි 59 සේනාංකයට අයත් භඨපිරිස් වලට අවශ්‍ය සංඥා සබඳතාවය සැපයීමේ මහත්වූ කාර්‍යය පැවරෙන ලදී. මෙය සිදුකරනු වස් උපක්‍රමික මූලස්ථානයක් හා ක්ෂේත්‍ර සංඥා වැඩපලක් නෙළුම්වැව ප්‍රදේශයේ 2008 පෙබරවාරි 12 දින විවෘත කරන ලදී.

මෙතෙක් නොවූ විරූ අන්දමින් හමුදා ආරක්‍ෂක වළලු වල සීඝ්‍ර ව්‍යාප්තියත් සමඟ බලඇණිය විසින් 59 සේනාංකයට සහ ඒ යටතේ අණ ලද භඨ පිරිස් වලට සංඥා සම්බන්ධතාවය සැපයීමේදී ඇතිවූ සාර්ථකත්වය ත්‍රස්ථවාදීන්ට එරෙහිව සිදුකරන ලද යුද්ධයෙහි සාර්ථකත්වයට ඉවහල්වූ බව අද අප හොඳින් දන්නා කරුණකි. මෙම කර්තව්‍යය ඉටු කිරීමේදී බලඇණයෙහි උපක්‍රමික මූලස්ථානයන් පහත දක්වා ඇති ස්ථානයන්හි ස්ථාපනය කිරීම එවකට පැවති ක්‍රියාන්විත අවශ්‍යතාවයන් සඳහා මහගු පිටුවහලක් විය.

අ. පුදුකුඩිඉරිප්පු - 2009 පෙබරවාරි 14
ආ. ඔඩ්ඩුසුඩාන් - 2009 සැප්තැම්බර් 30

බලඇණිය මෙම ස්ථානයන්හි ස්ථාපනය කිරීම යුද්ධයට සක්‍රියව දායක වන ව්‍යුහයන් සඳහා සංඥා සම්බන්ධතා සැපයීමට අවස්ථාව උදාකර දෙන ලදී. තවද එකවර ක්‍රියාකාරකම් කිහිපයක නිරතවීමට සිදුවීම පරිත්‍යාගයෙන් සහ කැපවීමෙන් ක්‍රියාකල නිළධාරීන්ට සහ සෙසුනිළයින්ට ඉතා දුෂ්කර විය. පහත සඳහන් හමුදා ව්‍යුහයන් සඳහා බලඇණිය විසින් සාර්ථක ලෙස සංඥා සම්බන්ධතා සපයන ලදී.

අ. 53 සේනාංකය
ආ. 59 සේනාංකය
ඇ. 4 වන කාර්‍ය සාධක බලකාය
ඈ. 8 වන කාර්‍ය සාධක බලකාය
ඉ. ප්‍රාදේශිය මූලස්ථානය වැලිඔය

ක්‍රියාන්විතයන් සමඟ බලඇණිය ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ නැවතත් ලුතිතන් කර්නල් පීඑජේ පීරිස්ගේ අණදිම යටතේ ස්ථාපනය කරන ලදී. මෙහිදී එය ආරක්‍ෂක සේනා මූලස්ථානය නැගෙනහිර යටතින් ඉවත්වන ලද අතර, ඉහත සඳහන් කල ව්‍යුහයන් සඳහා සංඥා සම්බන්ධතා සපයන ලදී.

මානුෂීය මෙහෙයුමෙන් අනතුරුව බලඇණිය මුලතිව් දිස්ත්‍රික්කයේ වට්ටප්පලෙහි ප්‍රදේශයෙහි අක්කර 50 ක භූමි ප්‍රදේශයක ආරක්‍ෂක සේනා මූලස්ථානය මුලතිව් යටතේ එහි පූර්ණ අනුමැතිය මත ප්‍රතිස්ථාපනය කරන ලදී. පසුව ආරක්‍ෂක සේනා මූලස්ථානය මුලතිව් යටතේ ඇති 59, 64 සහ 68 යන සේනාංක සහ එම සේනාංක යටතේ ඇති බලසේනා මූලස්ථාන 09 ක් යටතේ ඇති බලඇණි 28 ටත් වර්ථමානයේදී මෙම බලඇණිය විසින් සංඥා සබඳතාවය සපයනු ලබයි. මෙම ස්ථානයෙහි බලඇණිය ප්‍රතිස්ථාපනය කිරීම එවකට 1 ශ්‍රිලංසංබ අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් ඩබ්සීඑන් වරකාගොඩ පීඑස්සී විසින් 2009 සැප්තැම්බර්

30 වන දින ආරම්භ කරන ලදී.

පසුව 2010.12.03 දින ඒකක අණදීම ලුතිතන් කර්නල් ආර් ඇල්විටිගල ජ්‍යෙෂ්ඨ නිළධාරී භාර ගන්නා ලද අතර, නැවත 2012.03.16 දින ඒකක අණදෙන කාර්යය භාරය ලුතිතන් කර්නල් බීඩබ්එම්ජේඑ ප්‍රේමදාස ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් භාරගන්නා ලදී. පසුව ඒකක අණදීම 2013.10.19 වන දින ලුතිතන් කර්නල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී භාරගන්නා ලදී. පසුව 2015.02.14 දින ඒකක අණදීම ලුතිතන් කර්නල් සීපී අරංගල්ල පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් භාරගන්නා ලද අතර, මෙතෙක් අණදීම තත් නිළධාරී විසින් සිදු කරනු ලබයි.

2009.09.30 දින ඒකකයක් ස්ථාන ගත කිරීමට කිසිදු පහසුකමකින් තොර අක්කර 50ක ඝන කැලෑවක ස්ථානගත කරන ලද මෙම ඒකකය එදින සිට අණදීම සිදුකරන ලද සියළුම අණදෙන නිළධාරීන්ගේ හා සෙසුනිළයින්ගේ දැඩි කැපකිරීම, උත්සාහය හා උනන්දුව මත වසර 06 ක් වැනි කාලයක් තුල ඒකකයක තිබිය යුතු අත්‍යාවශ්‍ය ගොඩනැගිලි හා අනෙකුත් පහසුකම් පිලිසකර කර ගැනිමට හැකි විය. ඒ අනුව ආරක්ෂක සේනා මුලස්ථානය මුලතිව් යටතේ ස්ථාපිත අනෙකුත් ඒකකයන්ට වඩා කැපීපෙනෙන හා විධිමත්, අලංකාර කඳවුරු භූමියක් බවට මෙම ඒකකය පරිවර්තනය කර ගැනීමට හැකිවිය. ඒකකයේ ප්‍රධාන රාජකාරිය සංඥා සම්බන්ඳතාවය ලබාදීම වුවද එම රාජකාරිය ද ආරක්ෂක සේනා මුලස්ථානය මුලතිව් බලප්‍රදේශයේම පැසසුමට ලක්වන අයුරින් ඉටු කරන අතරතුර ඝණ වනාන්තරයක සියළුම පහසුකම් වලින් සමන්විත ඒකකයක් ගොඩනඟා ගැනීමට හැකිවීම යුධ ජයග්‍රහණයෙන් පසු අප ලැබූ විශිෂ්ඨතම ජයග්‍රහණය බැව් මෙහිලා සඳහන් කරමි.

ක්‍රිඩා ක්ෂේත්‍රයේදී 1 ශ්‍රිලංසංබ මල්ලවපොර, හොකීල මුෂ්ටි ප්‍රහාරකල මේස පන්දු, රග්බි සහ මලල ක්‍රිඩා යන අංශයන්ගෙන් ජාතික තලයේ ක්‍රිඩකයන් බිහි කරන ලදී. 1 ශ්‍රිලංසංබ සංඥා අයවළුන් පහත සඳහන් තරඟ ඉසව් වලින් ජාතික තලයේ දක්ෂතා පෙන්වන ලදී.

| නම | තරග ඉසව්ව | වෙනත් කරුණු |
|---|---|---|
| පතිරණ එච්ඒ | හොකි | සිංගප්පුරුවේදි සහ ආසියානු තරගාවලියේදි ශ්‍රිලංකාව නියෝජනය කිරීම |
| ජේආර් මෙන්ඩිස් | මල්ලවපොර | ඉන්දියාවේදි සහ ආසියානු තරගාවලියේදි ශ්‍රිලංකාව නියෝජනය කිරීම |
| පීඑස් රණසිංහ | රග්බි | ආසියානු තරගාවලියේදි ශ්‍රිලංකාව නියෝජනය කිරීම |
| මුලාෆර් එස්එම් | හොකී | හොංකොං හිදි හා තායිවානයේදි ශ්‍රිලංකාව නියෝජනය කිරීම සහ ශ්‍රිලාංකික කණ්ඩායමට නායකත්වය සැපයීම |
| හේමියදාස කේඑල් | හොකී | ශ්‍රිලංකාව නියෝජනය කිරීම |
| සන්තියාගෝ එම්ඒ | මේස පන්දු | ආසියානු ක්‍රිඩා උළෙල - ඉන්දියාව, අප්‍රිකාව, ලතින් ඇමෙරිකාව හා නයිජීරියාව යන රටවල් වලදී පැවැත්වූ ක්‍රිඩා උළෙලයන් හිදී ශ්‍රිලංකාව නියෝජනය කිරීම |
| සමරසිංහ වීකේඑල් | මලල ක්‍රිඩා/ මැරතන් | සාර්ක් තරඟාවලියේදි නේපාලයේදි සහ පාකිස්ථානයේදි ශ්‍රිලංකාව නියෝජනය කිරීම 1986 දි සහ 1989 දි අනුපිළිවෙලින් කත්මන්දුහිදි සහ ඉස්ලාමාද්හිදි රන් පදක්කම් දිනා ගැනීම |
| වීරසිංහ එස් | මලල ක්‍රිඩා | කල්කටාවෙහිදි පැවැත්වූ සාර්ක් තරඟාවලියේදි ශ්‍රිලංකාව නියෝජනය කිරීම |



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015

## 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ව්‍යාප්තියට අනුරූපව සංඥා රෙජිමේන්තුව ද ව්‍යාප්ත කිරීමට සිදුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1989 වර්ෂයේ මාර්තු මස 09 දින සංඥා බලකා මැණියන්ගේ කුසින් මෙළොව එළිය දුටු 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය තුල ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියමින් 26 වන වසරට පා තබා සිටී.

අප ඒකකය 21 සේනාංකය යටතේ අනුරාධපුර රණසේවාපුර ස්ථානගතව රාජකාරීන්හි නිරතව සිට 2007 සැප්තැම්බර් මස 18 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය - යාපනය බලප්‍රදේශය වෙත පැමිණ වසර 08 කට ආසන්න කාලයක් ගත වී ඇති මේ මොහොතේ ආසේමු(යා) වෙතින් පාලනය වන සේනාංක හා බලසේනාවන්හි සංඥා සම්බන්ධතා ගොඩනැගීමේ කාර්යයට දායකත්වයක් දක්වමින් ඉතා උසස් මට්ටමින් ඒකකයේ ගෞරවය, කීර්තිනාමය ගොඩනගා ගෙන ඇත.

තවද මෙම ඒකක 24 වන අණදෙන නිළධාරී වශයෙන් ලුතිතන් කර්නල් පීපීඑ ගුණසේකර යන ජ්‍යෙෂ්ඨ නිළධාරී 2013.05.31 දින සුභ මොහොතින් අණදෙන නිළධාරී තනතුරේ වැඩ භාරගෙන වත්මන් අණදෙන නිළධාරී වශයෙන් දැනට ඒකකයේ රාජකාරී ඉටු කරගෙන යනු ලබයි.

ආරක්ෂක සේනා මූලස්ථානය - යාපනය බලප්‍රදේශය තුල ඇති ඒකකයන්හි සංඥා රාජකාරීන් හි නිරතවීමට හැකි සෙබලුන් පිරිසක් බිහිකිරීමේ අරමුණින් මෙම වසර තුල නව ස්වයංක්‍රීය විනිමය හුවමාරුව හඳුන්වාදීමේ දින 06 ක වැඩමුළුවක් සහ විශේෂ පාබල බණ්ඩ පුහුණු පාඨමාලවන් හි සංඥා අධියරයන් 02 ක් මෙම වසර තුලදී පවත්වා සංඥා දැනුමින් ඔවුන් පෝෂණය කරන ලදී.





ඒකක 26 වන සංවත්සරය උදෙසා අණදෙන නිළධාරී වෙනුවෙන් පිරිණමන ලද සම්මාන පෙළපාළිය

එමෙන්ම 26 වන සංවත්සරයට සමගාමීව වැඩසටහන් මාලාවක් අණදෙන නිළධාරීගේ සහභාගිත්වයෙන් යුතුව ඒකකයේ පවත්වන ලදී. බලඝණ අතර ක්‍රිකට්, අත්පන්දු, පාපන්දු සහ එල්ලේ තරඟාවලියක් සංවිධානය කර ක්‍රිඩා හැකියාවන් ඔප්නැංවීම හා සාමුහිකව වැඩ කිරීම තුලින් ජයග්‍රහණය ලබා ගත හැකි බව ඒත්තු ගැන්වීමට කටයුතු කරන ලදී.

තවද 26 වන සංවත්සරයට සමගාමීව බෝධිපූජා පිංකමක් සියලු නිළධාරී සහ සෙසුනිළයින්ගේ සහභාගිත්වයෙන් නාග විහාරයේදි පවත්වන ලදි. නිළධාරීන් සහ සෙසුනිළයින් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් සහ සියලුම නිළයින් වෙනුවෙන් ඒකක ක්‍රිඩා පිට්යේදි උත්කර්ෂවත් අන්දමින් සංගීත රාත්‍රියක් පැවැත්වීමට කටයුතු කරන ලදි.

ඒකක සෙසු නිළයින්ගේ සුභාසාධනය වෙනුවෙන් නවතමයෙන් ඉදිකරන ලද මූලස්ථාන බලඝණ භඨ නිවාසය සහ සංඥා සම්බන්ධතා බලඝණ භඨ නිවාසය මෙම වර්ෂය තුල අණදෙන නිළධාරීගේ සුරතින් විවෘත කරන ලදි. සෙසුනිළ මුලුතැන්ගෙය සහ කොනොනි භෝජනාගාරය සඳහා මුල් ගල තබා මේ වන විට එය සියලු දෙනාගේ දායකත්වයෙන් ඉදිවෙමින් පවතී.

2015 වර්ෂයේ සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් බක් මහ උළෙලක් ඒකක ක්‍රිඩා භූමිය තුල 2015.04.15

වන දින සියලු දෙනාගේ සහභාගිත්වයෙන් පවත්වන ලද අතර. වෙසක් උත්සවය නිමිත්තෙන් ආසේමු (යා) වෙතින් පවත්වන ලද යාපනය වෙසක් කලාපය වෙනුවෙන් අලංකාරවත් වෙසක් කූඩුවක් නිර්මාණය කරමින් සංඥා බලකායේ සෙබලුන් තුළ පිරීපුන් සංඥා සෙබලකු පමණක් නොව නිර්මාණශිලි කලාකරුවකු ද සැඟව සිටින බවට ප්‍රදර්ශනය කරමින් මෙම ඒකකයේ නිර්මාණ හැකියාව පිළිබිඹු කරන ලදී. අවසන් වශයෙන් 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ඉදිරියටත් යුධ හමුදාව තුල දිනෙන් දින දියුණුවට පත්වේවායි එක සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.



ගරු රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය රුවන් විජේවර්ධන මැතිඳුන්ගේ මෙම ඒකක සංචාරයේ විශේෂ අවස්ථා



එවකට යුද හමුදා ප්‍රධාන මාණ්ඩලික නිළධාරීගේ කඳවුරු සංචාරය



2015.09.08 දින සංඥා බලසේනාධිපතිතුමාගේ ඒකක සංචාරය



අණදෙන නිළධාරීතුමන් ඒකක සෙනින්ගේ හඨ නිවාස විවෘත කිරීම හා උප අණදෙන නිළධාරීතුමන් නව මුලතැන්ගෙය සඳහා මුල් ගල තැබීමේ විශේෂ අවස්ථා



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015



2015.09.03 දින මෙම ඒකක දෙවන අණදෙන නිළධාරී වශයෙන් මේජර් එස්ඩී කොතලාවල යන නිලධාරීතුමන් වැඩභාර ගත් මොහොත



ඒකක 26 වන සංවත්සරය වෙනුවෙන් බලඝණයන් අතර පැවැති ක්‍රීඩා තරඟයන් හි විශේෂ අවස්ථාවන්



ඒකක සෙනින් වෙනුවෙන් පවත්වන ලද අලුත් අවුරුදු උත්සවයේ විශේෂ අවස්ථා

## 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

2015 ජුනි මස 05 වන දිනට වසර 24 ක සාඩම්බර ඉතිහාසයකින් සපිරි මෙම ඒකකය ශ්‍රී ලංකා සංඥා බලකායේ සිව්වන සාමාජිකයා වශයෙන් 1991 ජුනි මස 05 වන දින සුභ මොහොතින් ලුතිනන් කර්නල් එම් විත්‍රරංජන් ජ්‍යෙෂ්ඨ නිළධාරීගේ අණදීම යටතේ පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ආරම්භ කරන ලදී. එතැන් පටන් දිවයිනේ නොයෙකුත් ප්‍රදේශයන්හී සංඥා සම්බන්ධතා සපයමින් අවසන් වශයෙන් 2008 වසරේදී පැවති යුධ වාතාවරණය මධ්‍යයේ 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය මගින් අන්තර් ඒකක මාරුවීම් මත ස්ථාන මාරුවීම් සිදුකර මේ දක්වා අනුරාධපුර ඓතිහාසික පුදබිමේ ස්ථානගතවී ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශය යටතේ දඹුල්ලේ සිට වෙල්ලම්කුලම්, මන්නාරම සහ වැලිඔය යන සීමාවේ සේනාංක මූලස්ථාන 05 කට බලසේනා මූලස්ථාන 14 ක් ඇතුළුව පුහුණු පාසල්, රෙජිමේන්තු මධ්‍යස්ථාන සඳහා සංඥා සම්බන්ධතාවය පවත්වාගෙන යාමේ භාරදූර කර්තව්‍ය මෙම ඒකකය විසින් ඉටුකරනු ලබයි.

එහිදී විශේෂයෙන් මතක් කල යුතු කරුණු වනුයේ අනුරාධපුර ඉදිවෙමින් පවතින සඳහිරු සෑය ආවරණය වන පරිදි විශේෂ පිංකම් මාලාවන් සඳහා විශේෂ සංඥා උපකරණ භාවිතා කොට එම කටයුතු වල ශබ්ද විකාශන මෙන්ම සංඥා සම්බන්ධතාවය ලබාදීම වෙනුවෙන් යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ පැසසුමට ලක්වීම සහ දියකාවා යුද [illegible] සංඥා [illegible] ක්‍රියා කිරීම [illegible].



හිටපු යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා සංඥා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්එපිපි සමරසිංහ ආර්එස්පි යුඑස්පි පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිළධාරී මෙම ඒකකයේ සිදුකල සංචාරය

තවද විශේෂ කරුණක් වශයෙන් සඳහන් කරණුයේ යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ලැබූ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි හා සංඥා බලකායේ බලකාධිපති වශයෙන් රාජකාරී ඉටුකල මේජර් ජෙනරාල් එස්එපිපි සමරසිංහ ආර්එස්පි යුඑස්පි පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිළධාරීගේ විශ්‍රාම යෑමට ප්‍රථමයෙන් මෙම ඒකකයේ සිදුකල අවසන් සංචාරය දැක්වීමට හැක.

2013.12.06 වන දින 4 ශ්‍රීලංසංබ ඒකකයේ 16 වන අණදෙන නිළධාරී ලෙස වැඩ භාරගත් ලුතිතන් කර්නල් එස්එම් අතුකෝරළ පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිළධාරී එතැන් පටන් මේ දක්වා ඒකකයේ අභිවෘද්ධිය උදෙසා හා සියළුම නිළයින්ගේ දැනුම වර්ධනය කිරීමෙහිලා විශාල සේවයක් සිදුකර ඇත.



24 වන සංවත්සරය නිමිත්තෙන් අනුරාධපුර ශ්‍රී මහා බෝධිය අභියස පැවැත්වූ විශේෂ බෝධිපූජාව



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015



24 වන සංවත්සරය නිමිත්තෙන් අණදෙන නිළධාරීතුමා වෙත ලබාදුන් සම්මාන පෙළපාලිය හා සියලු නිල භෝජන සංග්‍රය .

2015 ජුනි මස 05 වන දිනට මෙම ඒකකයේ 24 වන සංවත්සරය යෙදී තිබුන අතර, මෙවරද ඉතා උසස් අන්දමින් සර්ව ආගමික වතාවත් වලට මුල් තැන දෙමින් සංවත්සර සැමරුම සිහිකරනු ලැබීය.

එම වැඩසටහන් මාලාවට අනුව:

1. 2015.05.25 සහ 26 යන දිනයන්හී මෙම ඒකකයේ සංඥා සම්බන්ධතා බලඝණය / මූලස්ථාන බලඝණය යනුවෙන් කණ්ඩායම් 2 ක් බැගින් සහභාගී වී වොලිබොල්, පාපන්දු සහ ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීම.

2. 2015.05.28 දින අනුරාධපුර ශාන්ති වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් සඳහා මෙම ඒකක කැලිප්සෝ සංගීත කණ්ඩායම යොදා සංගීත ප්‍රසංගයක් පවත්වා රාත්‍රී ආහාරය ලබාදීම.

3. 2015.05.30 දින ජය ශ්‍රී මහ බෝ සමිඳුන් අසලදී ඒකකයේ මියගිය, ආබාධිත තත්වයට පත්වූ රණවිරුන්ට සහ රාජකාරීයේ නියුතු සියලුම නිළයන් හට සෙත්පතා බොධිපූජා පිංකමක් සිදු කිරීමත්, ශුද්ධ වු එව්න්ද නැෂඩි දේවස්ථානයේ කතෝලික ආගමික හා කදිරේෂන් කෝවිල අනුරාධපුරහී දී විශේෂ දේව මෙහෙයන් සිදු කිරීම.

4. 2015.06.01 සහ 02 යන දෙදින තුල ඒකකයේ සෙසුනිළ භෝජනාගාරය තුල වරු පිරිතක් පවත්වා පසුදින ශ්‍රී විමලධර්මදූත විහාරස්ථානයේ සංඝයා වහන්සේලාට හා සිල් සමාදන් වු ගිහි පිරිස උදෙසා උදා / දිවා දානය පිරිනැමීම.



2015.05.28 දින අනුරාධපුර ශාන්ති වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් සඳහා රාත්‍රී ආහාරය ලබාදීම

5. 2015.06.05 දින අණදෙන නිළධාරී හට සම්මාන මුරයක් හා පෙළපාලියක් පිරිනැමීමත්, ඒකකයේ නිළධාරීන් හා සෙසුනිළයින්ගේ ප්‍රයෝජනය සඳහා ගොඩනැඟීමට නියමිත පුස්ථකාලය සඳහා මුල්ගල් තැබීම අණදෙන නිළධාරීතුමාගේ සුරතින් සුභ මොහොතෙන් ඉටුකරන ලද අතර ඒකක ප්‍රවාහන අංශය වෙනුවෙන් අධිසම්පීඩන ජල විදිනයක් ලබාදී එහි ප්‍රථම කාර්‍යයද අණදෙන නිළධාරීගේ සුරතින් සිදුකරන ලදී. එදින දහවල් සියලු නිළ භෝජන සංග්‍රහයක්ද සවස ඉතා සාර්ථක අයුරින් සියලු නිළ සුහද හමුවක්ද පවත්වන ලදී.

6. 2015.06.28 දින බනි/සැරයන් නිවස්න සාදයක්ද පවත්වන ලදී.

7. 2015.06.30 දින නිළධාරී නිවස්න සාදය උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

සංඥා රාජකාරීන්ට අමතරව මෙම ඒකකය ශ්‍රී ලංකා සංඥා බලකාය මෙන්ම අනිකුත් රෙජිමේන්තු සඳහා ඉදුරාම බඳවා ගන්නා ලද ආධුනිකයින්ද ඉතා උසස් මට්ටමින් පුහුණු කරනු ලබන අතර මේ දක්වා පාඨමාලා 31 ක් විසිර ගොස් ඇති අතර ආධුනික පුහුණු පාඨමාලා අංක 32 ඉතා සාර්ථකව පුහුණුවීම් කටයුතු සිදුකරනු ලබයි. මීට අමතරව ඒකක සෙනීන්ගේ වෘත්තීය දැනුම සහ ප්‍රවීණත්වය උදෙසා නිළ උසස් කිරීමේ පරීක්‍ෂණ , වෘත්තීය පරීක්‍ෂණ II සහ III නිරන්තරයෙන් සිදුකරනු ලබයි. සංඥා

රාජකාරීන් සහ පුහුණු රාජකාරීන්ට අමතරව මෙම ප්‍රදේශයේ පවතින විශේෂ උත්සව සඳහාත් ආරක්ෂක වැඩසටහන් සඳහාත් සිවිල් ක්‍රියාකාරකම් සඳහාත් සහයෝගය නිරන්තරයෙන් ලබාදෙනු ලබයි. ඊට අමතරව සෑම මසකම 05 වන දින ස්වාමීන් වහන්සේ නමක් ඒකකයට වැඩම කරවා ධර්ම දේශණා සිදුකිරීම තුලින් සියලු නිළයින්ගේ අධ්‍යාත්මික සංවර්ධනයට මංපෙත් විවර කර දී ඇත.

වත්මන් අණදෙන නිළධාරීගේ පුර්ණ අධීක්ෂණය යටතේ ගතවු අවුරුදු 1 1/2 ක කාලසීමාව තුල ඒකකයේ රාජකාරී ඉටුකරනු ලබන නිළධාරීන් / සෙසුනිළයන් සඳහා ඉටුකරනු ලැබු කාර්යයන් අතුරින් කිහිපයක්

1. අනුරාධපුර ප්‍රදේශයේ පැතිර යන වකුගඩු රෝගයෙන් මෙම ඒකක සෙනින් මුදවා ගැනිම සඳහා විශාල වියදමක් දරා ජලය පිරිසිදු කරන යන්ත්‍රයක් සවිකර ඇත.

2. ප්‍රධාන මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීම.

3. හඨ නිවාස නවීකරණය කිරීම.

4. කොනොනී සමාජ ශාලාව නවීකරණය කිරීම හා බුෆේ ක්‍රමයට ආහාර බෙදා ගැනිම සඳහා කොනොනී සමාජ ශාලාවට මෙන්ම සෙසුනිළ භොජනාගාරයටද බුෆේ කවිටල ලබාදීම.

5. සිවිල් සේවකයින් උදේසා සිවිල් සේවක නිවස්නය ඉදිකිරීම.

6. පුහුණු අංශය වෙනුවෙන් උපදේශකයින් උදෙසා හඨ නිවාසයක් සාදා නිම කිරීම.

7. සියලුම නිළයින් වෙනුවෙන් නවීන උපාංගයන්ගෙන් සමන්විත කායවර්ධන මධ්‍යස්ථානයේ වැඩ කටයුතු සීග්‍රයෙන් නිම වෙමින් පවති.

අවසාන වශයෙන් මව්බිමේ ඒකීය භාවය භෞමික අඛණ්ඩතාවය සහ ස්වෛරීභාවය ආරක්ෂා කිරීමෙහිලා උතුරු සහ උතුරු මැද ප්‍රදේශයන්හී සංඥා සම්බන්ධතාවය හා ආධාරක බලඇණී මෙහෙයුම් රාජකාරී ඉටුකරමින් සිටියදි තම තරුණ ජිවිතය පුජා කර ඇති අප ඒකක විරුවන් සහ ත්‍රස්ථවාදී ප්‍රහාර හේතුවෙන් තුවාල ලබා රණක්ෂිතයට පත්වී ඇති රණවිරුවන් ඉතා ගෞරවයෙන් සිහිපත් කරන අතර, 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ නිළධාරීන් සහ සෙසුනිළයින්ගේ අත්දැකිම් සහ පුහුණුව තුලින් තව දුරටත් ස්ථිර සහ ක්ෂණික සංඥා සම්බන්ධතාවක් ලබාදිම තුලින් යුද්ධ හමුදාවේ සමස්ථ අණ සහ පාලනයට අප ඒකකය සෘජුවම දායකත්වය ලබාදීමට වර්ථමානයේ මෙන්ම අනාගතයේදීත් හැකියාව ලැබේවායි පතමින්, සියලුම නිළධාරීන් හා සෙසුනිළයන්ටත් සිවිල් සේවක මහතුන්ටත්, ඔවුන්ගේ පවුල්වල සියලුම දෙනාටත් සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරන්නෙමු.



සියලු නිළයින්ගේ ප්‍රයෝජනය උදෙසා ඉදිකිරීමට නියමිත පුස්ථකාලය වෙනුවෙන් මුල්ගල් තැබීම



මෙම ඒකක ප්‍රවාහන අංශය වෙත අධිසම්පීඩන ජල විදිනය ලබාදීම





## 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

5 වන සංඥා රෙජිමේන්තුව ස්ථානගතව සිටි මුලතිව් සුතන්තිරපුරම් කඳවුර වර්ෂ 2014 ක් වු සැප්තැම්බර් මස 23 දින 16 ශ්‍රිලකාහ වෙත භාරදිමෙන් පසු වසර 22 ක් පුරාවට ඉටුකරන ලද ක්‍රියාන්විත රාජකාරී වලින් මිදි වෘත්තීය සංඥා ඒකකයක් වශයෙන් රාජකාරී ඉටු කිරීම පිණිස වර්ෂ 2014 ක් වු සැප්තැම්බර් මස 24 දින මඅපග වේයන්ගොඩ කඳවුරේ ස්ථානගතවන ලදී. වෘත්තීය සංඥා රාජකාරීන් වල යෙදීමට පෙර වෘත්තීය දැනුම වර්ධනය කර ගැනිම සඳහා සියලුම සංඥා ඒකකයන් වෙතින් උපදේශකයින් ගෙන්වාගෙන සංඥා බලසේනාධිපති තුමාගේ පුර්ණ අධීක්ෂණය යටතේ ඒකකයේ සියලුම සෙනින් හට 2015 ඔක්තෝම්බර් මස 09 දින සිට 2015 නොවැම්බර් මස 15 දින දක්වා සංඥා සංස්කරණ පාඨමාලාවක් පවත්වා සෙනින් හට සංඥා වෘත්තීය පිළිබඳ මනා දැනුමක් ලබා දෙන ලදී.

අනතුරුව 2015 දෙසැම්බර් මස 15 දින ආසේමු (බටහිර) බලප්‍රදේශයේ සංඥා රාජකාරීන් ඉටු කිරීම මෙම ඒකකය විසින් භාරගත් අතර දිස්ත්‍රික්ක 09 ක් ආවරණය වන පරිදි මෙම ඒකක සෙනින් සංඥා රාජකාරීන් සඳහා යොදවා සන්නිවේදන කටයුතු ඉතා සාර්ථකව ඉටුකරමින් පවති.

වර්ෂ 2014 දෙසැම්බර් මස 22 දින මෙම ඒකක මුලස්ථානය සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතේ සංඥා මූලික වැඩපොල පිහිටි හොඩනැගිල්ලේ ස්ථානගතවිය. ඒකකය වෙත පැවරුණු වගකිම් හා කාර්යයන් ඉතා උසස් අයුරින් ඉටුකල අතර පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය, 73 වන නිදහස් උළෙල, 6 වන විජයග්‍රාහී පෙළපාලිය ඇතුලු බොහෝ රාජ්‍ය උත්සව අවස්ථාවන්හිදී මෙම ඒකකය වෙතින් අදාල සියලුම සංඥා රාජකාරීන් ඉතා උසස් අන්දමින් ඉටුකිරීම හේතුවෙන් උසස් මුලයන්ගේ නිරන්තර පැසසුමට ලක්වී ඇත.

ඒකක අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් බීඅයි අස්සලාරච්චි යුඑස්පි පිඑස්සි යන ජ්‍යෙෂ්ඨ



2014.09.23 දින ඒකකය ආසේමු (මු) බලප්‍රදේශයේ රාජකාරී වලින් බැහැරව යාමට පෙර 68 සේමු සේනාංකාධිපතිතුමා සහ 683 බසේමු බලසේනාධිපතිතුමා විසින් හට පිරිස් ඇමතිම.



2014.09.23 දින 16 ශ්‍රිලකාහ වෙත ඒකක බලප්‍රදේශය භාරදිම හා අණදෙන නිළධාරී විසින් හට පිරිස් ඇමතිම.

නිළධාරීගේ මගපෙන්වීම යටතේ සියලුම නිළධාරීන්ගේ සහ සෙසුනිළයින්ගේ නොමඳ කැපකිරීම සහ උත්සාහය මත ප්‍රථම වතාවට 5 ශ්‍රීලංසංබ 2014 වසරේ සංඥා රෙපිමේන්තු අතර හොඳම සංඥා රෙපිමේන්තුව බවට පත්විය.

එමෙන්ම 5 ශ්‍රීලංසංබ වෙත ආධුණික සෙනින් ලෙස ඇතුලත්වූ අයවලුන් ප්‍රථම වතාවට වසර 22 ක සේවාකාලයකින් පසු විශ්‍රාම යාමද මෙම වසරේ සිදුවූ විශේෂ සිදුවීමක් ලෙස පෙන්වා දිය හැකිය. ඒ අනුව සෙනින් 83 දෙනෙකු දැනට විශ්‍රාම පූර්ව නිවාඩු ලබා නිවෙස් වෙත මුදා හැර ඇත.

5 වන රෙපිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් මෙතෙක් දේශය වෙනුවෙන් අභීතව කරන ලද උදාර මෙහෙවර අනාගතයේදී ද සාර්ථකව ඉටු කිරීමට ශක්තිය හා ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනය කරන්නෙමු.



2014.10.19 දින 2014 වර්ෂයේ සංඥා රෙපිමේන්තු අතර හොඳම සංඥා රෙපිමේන්තුව බවට මෙම ඒකකය පත්වීම.



2014.10.09 දින සිට 2014.11.15 දින දක්වා පැවැති සංඥා සංස්කරණ පාඨමාලාවේ දි සෙනින් විසින් සංඥා රාජකාරීන් පිළිබඳව දැනුම ලබාගත් ආකාරය.



2014.10.09 දින ආරම්භ කරන ලද සංඥා සංස්කරණ පාඨමාලාවේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පැමිණි සංඥා බලසේනාධිපතිතුමාට ලබාදුන් සම්මාන මුරය හා ඔහු විසින් හට පිරිස් ඇමතීම.



2015.03.19 දින 5 ශ්‍රීලංසංබ වෙත ආධුණික සෙනින් ලෙස ඇතුලත්වූ අයවලුන් ප්‍රථම වතාවට වසර 22 ක සේවාකාලයකින් පසු විශ්‍රාම යාම නිමිත්තෙන් පවත්වන ලද තේ පැන් සංග්‍රහය.



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015



2015.01.02 දිනට යෙදුනු ඒකක 21 වන සංවත්සරය නිමිත්තෙන් පවත්වන ලද තේපැන් සංග්‍රහය.



2015.09.01 දින සංඥා රෙපිමේන්තුවේ පළමු බලඇණි පුහුණුවීම් පාඨමාලාව ලෙස මෙම ඒකකය විසින් සංඥා පාසලේ සේනාවිධායකතුමාගේ ප්‍රධානත්වයෙන් මාබේරියතැන්න පුහුණු අනුකණ්ඩයේ දී ආරම්භ කිරීම.



2015.09.17 දින සංඥා බලඇණි පුහුණුවීම් පිළිබදව සොයා බැලීම සදහා සංඥා බලකාධිපතිතුමා නිරීක්ෂණ චාරිකාවක යෙදුනු අවස්ථාව.



2015 වර්ෂයේ මෙම ඒකකය වෙතින් සංවිධානය කරනු ලැබූ ක්‍රිඩා තරඟයන්හි ඒකක සෙනින් ක්‍රිඩාවන්හි නිරත වූ අවස්ථා.



2015.09.19 දින සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ උපදෙස් පරිදි සංවිධානය කරන ලද විනෝද චාරිකාව



7 ශ්‍රීලංසංබ ආබාධිත රණවිරුවෙකු සඳහා මිනුවන්ගොඩ ප්‍රදේශයේ මෙම ඒකකය වෙතින් ඉදිකරන ලද නිවස.

## 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙසින් පෘතුවි තලය මත විරූදාවලියලත් සොබා සෞන්දර්යයෙන් පොහොසත් මේ පුංචි ලක් දෙරණෙහි වසර 30 කට අධික කාලපරාසයක් තුල පැවැති යුධ ගිණි දැල් නිමවී උදා වු අරුණෝදයේ ආශ්චර්යය මධ්‍යයේ තම 19 වන වියට පා තැබු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සන්නිවේදනයේ ප්‍රමුඛයා වන ශ්‍රී ලංකා සංඥා බලකායේ 2 වන ආධාරක බලඇණිය ලෙස 1997.01.10 වන දින ආරම්භ කරනු ලැබු 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය (ආධාරක බලඇණිය) තම ගෙවී ගිය වසර 18 ක කාලපරාසයෙහි අභිතාවර්ජනය "ද සිග්නලර්" සඟරාවේ පසුගිය කලාපය තුලින් එළි දැක්වු බැවින් ගෙවී ගිය පසුගිය වසර තුල සිදුවු විශේෂිත සිදුවීම් පමණක් මෙසේ සනිටුහන් කරන්නෙමු.



2015.02.11 දින නව අණදෙන නිළධාරී ලෙස ලුතිතන් කර්නල් කේසී ප්‍රතාපසිංහ ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමා වැඩ භාර ගැනිම

මේ වන විට එකකය ආසේමු (යා) බල ප්‍රදේශයේ 51 සේනාංක මූලස්ථානයට අයත්ව 512 බලසේනා මූලස්ථානය යටතේ යාපනය නගරය ආසන්නයේ සෞන්දර්යමත් භූමි ප්‍රදේශයක නවතමයෙන් ඉදි කරන ලද අලංකාරවූත්, දර්ශනීයවූත් කඳවුරක ස්ථානගතව මෙම එකක අණදෙන නිළධාරී වන ලුතිතන් කර්නල් කේසී ප්‍රතාපසිංහ යන ජ්‍යෙෂ්ඨ නිළධාරීගේ අණදීම යටතේ උසස් මූලස්ථානයන් වෙතින් පැවරෙන රාජකාරීන් හා වගකීම් ඉතා උසස් අන්දමින් ඉටුකරමින් සිවිල් වැසියන්ගේද සිත් දිනා ගනිමින් ඔවුන්ගේ ප්‍රශ්න හා ගැටලු සම්බන්ධයෙන් නිරන්තරයෙන් අවධානය යොමුකරමින් ජන ජිවිතය යළි ප්‍රබුද්ධාලීම සඳහා සහයෝගය ලබා දෙමින් රාජකාරී ඉටුකරනු ලබයි.



2015.04.28 දින හිටපු යුධ හමුදා මාණ්ඩලික ප්‍රධානි සහ සංඥා බලකාධිපතිගේ එකක සංචාරය



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015




2015.06.16 වන දින 18 වන සංවත්සරය සැමරීම

මෙම එකකය ආධාරක බලඇණියක් ලෙස රාජකාරී කරමින් සිටියදී එය 2014.06.16 දින සිට තොරතුරු තාක්ෂණ එකකයක් ලෙස ප්‍රතිස්ථාපනය වෙමින් පවතින මොහොතක, මෙම එකකයේ 18 වන සංවත්සරය 2015.06.16 වන දිනට යෙදී තිබු අතර, එයට සමගාමීව එකකයේ රාජකාරීයේ නියැලී සිටියදී ත්‍රස්ථවාදය මෙරටින් තුරන් කර නිදහස් නිවහල් දේශයක් මතු පරපුරට උරුම කරලීමේ පරම අදිටනින් යුතුව තම ජිවිත පුදකල සියලු රණවිරුවන් හට නිවන් සුවයද, තුවාල ලබා ආබාධිත තත්වයට පත් සියලුම රණවිරුවන් හට ඉක්මන් සුවයද ප්‍රාර්ථනා කරමින් ශ්‍රී නාගදීප පුද බිමේදී බෝධි පූජා පිංකමක් පවත්වන ලදි. තවද සියලු නිළ භෝජන සංග්‍රහයක් හා සියලු නිළ සුහද හමුවක් ආදී වශයෙන් විශේෂාංග රැසකින් යුතුව මහත් උත්කර්ශවත් ලෙස එකක සංවත්සරය සමරන ලදි.

එමෙන්ම එකකයේ ක්‍රිඩා කුසලතාවයන්ද ඉතා උසස් මට්ටමක පවතින අතර, දක්ෂතාවයන්ගෙන් හෙබී ක්‍රිඩකයින් සංඥා බලකා මෙන්ම යුද හමුදා ක්‍රීඩා කණ්ඩායමද නියෝජනය කරනු ලබන අතර, මෙම එකක වෙඩිතැබීමේ කණ්ඩායම 2015 වසරේ අන්තර් රෙජිමේන්තු වෙඩි තැබීම් තරඟාවලියේදී ශූරතාවය හා මෙම එකක ජිම්නාස්ටික් කණ්ඩායම අන්තර් එකක ජිම්නාස්ටික් තරඟාවලියේදී ශූරතාවය දිනා ගැනිම මෙන්ම අනෙකුත් ක්‍රිඩාවන් වලදී ද ජයග්‍රහණ රැසක් හිමිකර ගෙන දක්ෂතාවයන් පෙන්වා ඇත. තවද ආසේමු(යා) බල ප්‍රදේශය



ආගමික වතාවත් සිදු කිරීම සඳහා ඇති බුදු මැදුර

තුල සේනාංක මූලස්ථාන, බලසේනා මූලස්ථාන හා එකකයන් වෙතින් පවත්වනු ලැබු ක්‍රිඩා තරගාවලියන්හීද ජයග්‍රහණ රැසක් හිමිකර ගැනීම තුලින් එකකයේ ක්‍රිඩා හැකියාවන් පිළිබිඹු කෙරේ.

තවද, එකක සෙබලුන්ගේ නිළ උසස් කිරීම් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාලීම සඳහා සංසෙ සිට ලා/කෝ දක්වා නිළ උසස් කිරීමේ පාඨමාලාවක් පැවැත්වු අතර, එකකයෙන් පිටත අනෙකුත් ස්ථාන වෙතින් පවත්වනු ලබන පාඨමාලාවන් සඳහා වැඩි සෙබලුන් සංඛ්‍යාවක් සහභාගි කරවමින් ඔවුන්ගේ ඉදිරි හමුදා ජිවිතය සාර්ථක කිරීමට කටයුතු කරමින්, අනෙකුත් සුභසාධක කටයුතු පිළිබඳවද නිරන්තරයෙන් සොයා බලා ක්‍රියාකිරීම තුලින් සෙබලුන්ගේ චිත්ත ධෛර්යය උසස් අන්දමින් පවත්වාගෙන යාමට පිටුවහලක් වී ඇත. එබැවින් ඔවුන් වෙත පැවරෙන රාජකාරී මනා කැපවීමෙන් හා වගකීමෙන් මෙන්ම උනන්දුවෙන් ඉටුකිරීම එකකයේ සාර්ථකත්වයටද ප්‍රධාන සාධකයකි.

මෙම එකකය සංඥා බලකා පවුලට එක්වී දැනට වසර 18 කට වැඩි කාලයක් ඉක්මවා ගොස් ඇති අතර, එම කාලපරාසය තුල එකකයේ සාර්ථකත්වයට අණදෙන නිළධාරීවරුන් 14 දෙනෙකු නායකත්වය ලබා දී ඇත. වත්මන් අණදෙන නිළධාරීගේ නායකත්වය හා මඟපෙන්වීම යටතේ එකකයේ සියළුම අංශයන් හි ඉදිරි කටයුතු ඉතා උසස් අන්දමින් ඉටුකිරීමට හැකියාව ලැබී ඇති අතර එය එකකයේ

සාර්ථකත්වය සඳහා ඉමහත් පිටුවහල ක් වී ඇත.

තම 18 වන සැතපුම පසුකරමින් 19 වන සැතපුමට පා තැබූ 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ආරම්භයේ සිට මේ දක්වා පැමිණි ගමන් මඟෙහි සාර්ථකත්වයට දායකත්වය ලබා දෙමින් තම ජීවිත පුදකල හා තුවාල ලබා ආබාධිත තත්වයට පත් සියලුම නිළධාරී/ සෙසුනිළයින්ද දැනට රාජකාරියේ යෙදී සිටින සියලුම නිළධාරී / සෙසුනිළයින්ද ඉතාමත් භක්ති ප්‍රණාමයෙන් යුතුව සිහිපත් කරන්නෙමු. මෙවන් වූ අමිල මෙහෙයක් ඉදිරියටත් ඇප කැපව ඉටු කරමින් 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ආධාරක බලඇණියක් වශයෙන් ඉටු කරනු ලැබූ රාජකාරී වලින් මිදී නුදුරේදී තොරතුරු තාක්ෂණ ඒකකයක් වශයෙන් තම රාජකාරී ඉටු කිරීමට පෙර මඟ බලා සිටින අතර එම තොරතුරු තාක්ෂණ රාජකාරීන්ද උසස් අන්දමින් ඉටුකරමින් 6 වන රෙජිමේන්තුව සංඥා බලකා නාමය ශ්‍රී ලංකා සංඥා බලකාය තුල මෙන්ම සමස්ථ යුද්ධ හමුදාව තුල ද දීප්තිමත් ඒකකයක් ලෙස වැජඹෙන්නට ප්‍රාර්ථනා එක් කරමින් පසුගිය වසරෙහි අතිතාවර්ජනය මෙසේ සමාප්ත කරන්නෙමු.



අලංකාරවත් ලෙස ඉදි කරන ලද අණ දෙන නිළධාරී නිවස්නය හා නිළධාරී නිවස්නය



2015.05.31 දින සංඥා සෙබලුන්ගේ පවුල්වල සමාජිකයන්ගේ දායකත්වයෙන් පවත්වන ලද පොසොන් සීල ව්‍යාපාරය





## 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

වර්ෂ 2008 ක් වූ පෙබරවාරී මස 8 වන දින නිළධාරීන් 18 ක් සහ සෙසුනිළයින් 525 ක ගෙන් සමන්විතව ආධාරක බලඇණියක් ලෙස ආරම්භ කරන ලද 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ගෙවී ගිය වසර 07 ක කාලපරාසයෙහි අතීතාවර්ජනයන් පසුගිය "ද සිග්නලර්" සඟරාව මගින් එළිදැක්වූ බැවින් ගෙවී ගිය වසර තුළ ...දැවූ විශේෂිත සිදුවීම් පමණක් ...ගෙන මෙසේ සනිටුහන් කර කරන්නෙමු.

ආධාරක බලඇණියක්ව ...වති 7 වන සංඥා බලකාය වර්ෂ 2013 මාර්තු මස 10 වන දින සිට සංඥා සම්බන්ධතා සපයන ඒකකයක් ... ආරක්ෂක සේනා මුලස්ථානය (...) හි මූලික වශයෙන් ස්ථානගත ... ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) සහ ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බලප්‍රදේශයන් දෙකෙහි සන්නිවේදන රාජකාරීන් ඉතා සාර්ථකව ඉටුකල අතර 5 ශ්‍රීලංසංබ ඒකකය විසින් ආරක්ෂක සේනා මූලස... (බටහිර) බල ප්‍රදේශයේ සංඥා රාජකාරී ඉටුකිරීම ආරම්භ කිරීමෙන් පසු වර්ෂ 2013 මාර්තු මස 13 වන දින සිට ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) හි දිස්ත්‍රික් 6 ක් ආවරණය කරමින් සංඥා රාජකාරීන් ඉටු කරනු ලබයි.



2015 මාර්තු මස 06 වන දින නව අණදෙන නිළධාරී වශයෙන් ලුතිතන් කර්නල් පීඑස් ෆොන්සේකා යුඑස්පී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරී සුභ මොහොතින් වැඩභාරගත් අවස්ථාව.

දියතලාව නරියා කන්දට සමීපව පිහිටි මැණික්කන්ද ප්‍රදේශයේ මෙම ඒකකය වෙත වෙන් කෙරුන දර්ශනීය ස්ථිර භූමි භාගය තුළ නිළධාරීන් / සෙනින් සඳහා අවැසි මූලික අවශ්‍යතාවන් සපුරා ගැනීමෙන් පසු 2014.12.26 වන දින එළැඹි සුභ මොහොතින් නව කඳවුරක් වශයෙන් ස්ථාපිත වූ අතර ඒකක නිළධාරීන් / සෙනින්ගේ අපරිමේය උත්සාහය සහ උනන්දුව මත නව ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

2014 වසරේ සංඥා ඒකක අතර පැවති ක්‍රිඩා හා පාලන කටයුතු ඇගයීමේදී මෙම ඒකක සෙනින් කැපී පෙනෙන ජයග්‍රහණයන්ට හිමිකම් ලද අතර එම වසර තුළ සංඥා ඒකක අතුරින් දෙවන ස්ථානය සඳහා හිමිකම් කීමට භාග්‍ය උදාවිය.

එමෙන්ම යුද්ධ හමුදාධිපති තුමන්ගේ සංකල්පයට අනුව සෙබලුන්ගේ ක්‍රිඩා කෞෂල්‍යය හා චිත්ත ධෛර්යය ඔප්නැංවීමේ අරමුණින් ආසේමු මට්ටමින් පවත්වන ලද ක්‍රිඩා තරඟාවලිය සඳහා සහභාගි වන ලද ආසේමු. සේනාංක. බසේමු. ඒකක හා අණුඛණ්ඩ අභිබවා සමස්ථ තරඟාවලියේ ශූරතාවය හිමිකර ගනිමින් ආසේමු (මධ්‍යම) තුළ දිදුලන ඒකකයක් බවට පත්වීමේ භාග්‍ය උදාකරගත් බව දැනුම් දෙනුයේ ඉතාමත් ආඩම්බරයෙනි.

පසුගිය යුධමය කාලසීමාව තුළ හා ඉන් පසු පැවති අවිවේකීතාවය හා රාජකාරී බහුලතාවය මත විශාල වශයෙන් ගොනුවන ලද මූලික සංඥා පාඨමාලාවන් සහ නිළ උසස් කිරීමේ පාඨමාලා හදාරා නොමැති සෙනින්ගේ අභිවෘද්ධිය සඳහා වර්තමානයේ උද්ගතවී ඇති නොයෙකුත් අපහසුතා සහ දුෂ්කරතාවයන්ද අභියෝගයන්ට ලක්කරමින් මේ වන විට ඒකකය තුළ නිළ උසස් කිරීමේ පාඨමාලා 4 ක් පවත්වා සෙනින් 124 දෙනෙක්ද, වෘත්තීය පරීක්ෂණ පාඨමාලා 3 ක් පවත්වා සෙනින් 47 දෙනෙක්ද සමත් කර ඇති අතර. මෙම ඒකක සෙනින්



සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී එන්ඩියු පීඑස්සී යුඑස්එසීපීඑස්සී 7 වන සංඥා බලකා ඒකක සංචාරය.

අතුරින් ලාන්ස් කෝප්‍රල් - 41 , කෝප්‍රල් - 44 , සැරයන් - 09 සහ බනි 11 - 09 ක් යන නිළයන් හට උසස් කිරීම් ලබා දීමට හැකි වූ බව ඉතා සතුටින් දන්වා සිටිමු.

ඒකකයේ 7 වන සංවත්සරයට සමගාමීව 2015.02.08 දින අණදෙන නිළධාරී වශයෙන් රාජකාරී කරන ලද ලුතිතන් කර්නල් ආර්එම්පීඑස්බී රත්නායක ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමන් වෙත සම්මාන මුරයක් හා ආචාර පෙළපාලියක් පවත්වන ලදී. අනතුරුව සියලු නිළ භෝජන සංග්‍රහයක් පැවැත්වූ අතර එදින රාත්‍රියේ මැණික්කන්ද විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වය මත ඒකකයේ නිළධාරී / සෙසුනිළයින්ගේ සහභාගීත්වයෙන් මෙම ඒකකය නමින් මිය පරලොව ගිය රණවිරුවන්ට නිවන් සුවයද, ආබාධිත තත්වයට පත් රණවිරුවන් හට නීරෝගී සුවය මෙන්ම නව කඳවුරට සෙත් පතා සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක් ද මෙම කඳවුර තුල ප්‍රථම වතාවට පවත්වන ලදී, අනතුරුව 2015.02.09 දින සංඝයා වහන්සේ 15 නමකට හීල් දානය පිළිගැන්වූ අතර 2015.02.10 දින සියලු නිළ සුහද හමුවක් පවත්වන ලදී.

සංඥා සම්බන්ධතා ඒකකයක් ලෙස පරිවර්ථනය වීමේ විශාල අභියෝගය භාරගෙන ඒකකය වෙත නායකත්වය සැපයු ලුතිතන් කර්නල් ආර්එම්පීඑස්බී රත්නායක ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමන් 2013 මාර්තු 16 දින සිට 2015 මාර්තු 6 වන දින දක්වා මෙම ඒකකයේ අණදෙන නිළධාරී ලෙස කටයුතු කර ගෞරවනීය හා අභිමානවත් සේවයෙන් නික්මයාමෙන් පසු 2015 මාර්තු මස 06 වන දින සිට නව අණදෙන නිළධාරී ලෙස ලුතිතන් කර්නල් පීඑස් ෆොන්සේකා යූඑස්පී පීඑස්සී යන නිළධාරී විසින් රාජකාරී ඉටුකරනු ලබයි.

අභිමානවත් සන්නිවේදන මාධ්‍යයෙන් සමස්ථ යුධ හමුදාවට දායකත්වය ලබාදීමට නවතමයෙන් පිහිටුවනු 7 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ ඉදිරි ගමන් මග සාර්ථක කරගැනීමට සියලු නිළධාරීන්හට හා සෙසුනිළයින්ට අවශ්‍ය ධෛර්යය සහ ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

ඒකකය දියතලාවෙහි ස්ථාන ගත වීමෙන් පසු ඒකකය නව ස්ථානයේ මේ දක්වා ගොඩනැගීමට එහි අභිවෘද්ධියට හා ගුරුහරුකම් ලබාදෙමින්ද නන් අයුරින් උපකාර කරමින් හා සංඥා බලකායේ අභිවෘද්ධියට නිරතුරුවම තම කාලය කැපකරන හිටපු බලකාධිපති වරුන්, නව බලකාධිපතිතුමන්, ප්‍රධාන සංඥා නිළධාරීතුමන්, හිටපු සංඥා බලසේනාධිපතිතුමන්, නව සංඥා බලසේනාධිපතිතුමන් හා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක තුමන්ද ගෞරවයෙන් යුතුව සිහිපත් කරමු.



7 වන සංවත්සරය සඳහා එවකට අණදෙන නිළධාරී වශයෙන් රාජකාරී කරනු ලැබූ ලුතිතන් කර්නල් ආර්එම්පීඑස්බී රත්නායක යන ජ්‍යෙෂ්ඨ නිළධාරී වෙත පිරිනමනු ලැබූ සම්මාන පෙළපාලිය.



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015



මියගිය හා ආබාධිත රණවිරුවන් හට නීරෝගී සුවය මෙන්ම නව කඳවුරට සෙත් පතා පවත්වන ලද සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව.



අධික සුළං හේතුවෙන් නිවාස සහ පාසැල් වෙත කඩාවැටුනු ගස් ඉවත් කිරීම හා පස්කඳු කඩාවැටීම හේතුවෙන් අවහිර වන ලද දුම්රිය ගමනාගමනය යථාතත්වයට පත්කිරීම සඳහා මෙම ඒකක සෙනින්ගේ දායකත්වය



2015 සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් ආසේමු (මධ්‍යම) පෙරහැර පවත්වන ලද අවුරුදු උත්සවය සඳහා මෙම ඒකකය වෙතින් නිර්මාණය කරන ලද ගැමිගෙදර



2015 පොසොන් පොහෝ දින පවත්වන ලද ශීල සමාධි වැඩසටහන් මාලාව සඳහා සහභාගීවන ලද උපාසක උපාසිකාවන් වෙත දහවල් දානය පිරිනමන ලද අවස්ථාව

## 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

2008 ජුලි මස 15 වන දින ආරම්භ කරන ලද 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය කිලිනොච්චිය ඉරණමඩු මංසන්ධියේ ස්ථානගතව ඇති අතර, යුද්ධය නිමාවී සාමයේ අරුණාළු උදාවෙමින් පවතින මේ මොහොතේ 2015 ජුලි මස 15 වන දිනට 9 ශ්‍රීලංසංබ ගමන් මගෙහි 07 වන සැතපුම් කණුව පසු කිරීමට තරම් අපි වාසනාවන්ත වෙමු. මෙම අසිරිමත් අවස්ථාව වන විට ලුතිතන් කර්නල් පීසීවී ප්‍රනාන්දු යන ජ්‍යෙෂ්ඨ නිළධාරීගේ අණදීම යටතේ ඒකකය පාලනය වන අතර, 07 වන සැමරුම චාම් මෙන්ම අභිමානවත් අයුරින් සැමරීමට සියළු නිළයින් විසින් කටයුතු කරන ලදි.

ඒකක අණදෙන නිළධාරී වැඩ අරඹන විට මුල්ගල තබා වැඩ ආරම්භ කර තිබූ ඒකකයේ "නව බුදු මැදුර" ඉතාමත් කෙටි කලකින් අලංකාරවත් ලෙස වැඩ නිමකරන ලද අතර. එහි අලංකාරවත් බුදුපිළිමයක් තැන්පත් කිරීම සංඝරත්නයේ ආශිරවාදය මැද 2015 මාර්තු 07 දින සිදු කරන ලදි.

### පුහුණුවීම්

2015 වසරේ පුහුණු සැලැස්ම අනුව ඒකකය වෙතින් මේ වන විට සංසෙ සිට ලා/කෝ දක්වා නිළ උසස් කිරීමේ පාඨමාලා 01ක්, ලා/කෝ සිට කෝප්‍රල් දක්වා නිළ උසස් කිරීමේ පාඨමාලා 01ක් සහ වෘත්තීය පරීක්ෂණ දෙවන ශ්‍රේණිය පරීක්ෂණයක්ද පවත්වන ලදී. තවද මේ වන විට සංසෙ සිට ලා/කෝ දක්වා නිළ උසස් කිරීමේ පාඨමාලාවක් ආරම්භ කර ඇත. ඊට අමතරව සංඥා බසේමු උපදෙස් පරිදි ආසේමු(කිලි) බලප්‍රදේශයට අයත් ඒකක සෙනින්හට වෙනත් ඒකක සංඥා පුහුණු පාඨමාලාවක් පවත්වන ලද අතර එහි දෙවන පාඨමාලාව මේ වන විට ආරම්භ කර ඇත. තවද ඒකක සෙනින්ගේ / නිළධාරීන්ගේ දැනුම වර්ධනය කිරීමෙහිලා යුධ හමුදා පුහුණු දිනය යෙදී ඇති බදාදා දිනයෙහි සියළු අයවළුන් පුහුණුවීම් වල යොදවන අතර, ආරාධිත දේශණ මගින් සෙනින්ගේ ඉදිරි දිවියට පිටුවහලක් වන දේශණ පවත්වනු ලබයි.

### ජ්‍යෙෂ්ඨ නිළධාරී සංචාර

විශ්‍රාමික යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන හා සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් එස් ඒ පී පී සමරසිංහ ආර්එස්පී යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීමට ප්‍රථම සිදු කරන ලද අවසන් නිළ ඒකක සංචාරය 2015.04.28 දින සිදු කරන ලදි.



සමුගැනීම සනිටුහන් කරමින් සමරු පොතෙහි සමරු සටහන තබමින්

### පත්වීම් - ජ්‍යෙෂ්ඨ නිළධාරී



මෙම ඒකක අණදෙන නිළධාරී වශයෙන් රාජකාරී කරන ලුතිතන් කර්නල් පීසීවී ප්‍රනාන්දු ජ්‍යෙෂ්ඨ නිළධාරී ශ්‍රී ලංකා රයිෆල් සංගමයේ (National Rifle Association ) ලේකම් ධුරයට තේරී පත් වී ඇත. මෙම ජ්‍යෙෂ්ඨ නිළධාරී ශ්‍රී ලංකා වේ පැවැත්වෙන වෙඩි තැබීම් තරඟ වලදී තරඟ විනිසුරුවරයෙකු වශයෙන්ද කටයුතු කරන සංඥා බලකායට කීර්තියක් ගෙන දෙන ජ්‍යෙෂ්ඨ නිළධාරීයෙකි.

### නෙළුම් පියස ශ්‍රවණාගාරය

මෙම ඒකක කඳවුරු භූමියේ ස්ථාපිත එල්ටීටීඊ පාලන සමයේ ඔවුන්ගේ රැස්වීම් ශාලාවක් වශයෙන් පවත්වාගෙන ගිය ස්ථානය ආසේමු (කිලි) අධීක්ෂණය යටතේ ආසේමු (කිලි) යටතේ ඇති මූලස්ථාන, ඒකක දායකත්වයෙන් යුතුව නැවත ප්‍රතිසංස්කරණය කර සියළු රාජ්‍ය හා පුද්ගලික ආයතනයන්හි අවශ්‍යතාවයන් සඳහා පවත්වාගෙන යනු ලබයි. මෙහි යුධ හමුදාවේ, රාජ්‍ය ආයතන හා පුද්ගලික ආයතන අවශ්‍යතාවයන් පරිදි රැස්වීම් උත්සව පැවත්වනු ලැබේ.





මෙම උත්සව ශාලාවේ සියළු නඩත්තු කටයුතු ඒකක අණදෙන නිළධාරීගේ උපදෙස් පරිදි 9 ශ්‍රීලංසංබ ඒකකය විසින් ඉටුකරනු ලබයි.

### ලෝක විදුලි සංදේශ දිනය

විදුලි සංදේශ නියාමන දිනයට සමගාමීව මෙම ඒකකය විසින් සංවිධානය කර කඳවුරු භූමියේ ස්ථාපිත නෙළුම්පියස ශ්‍රවණාගාරයේ 2015 මැයි මස 18 දින පවත්වන ලද දේශණය සඳහා ආසේමු (කිලි) බලප්‍රදේශය තුල ඉගෙනුම ලබන පාසල් සිසුන් 300ක පමණ ප්‍රමාණයක් සහභාගි වු අතර, එම අවස්ථාවේ දේශණ සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ දේශක උපුල් ඒකනායක මහතා සහභාගිවන ලදී.





අලංකාරවත් ලෙස වැඩ නිමකරන ලද නව බුදු මැදුරට බුදුපිළිමයක් තැන්පත් කිරීම

ඒකක කඳවුරු භූමියේ පිහිටි නෙලුම් පියස ශ්‍රවණාගාරය



# 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය (සන්නිවේදන තාක්ෂණ)

1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය පිහිටුවීමෙන් අනතුරුව යුද හමුදාව තුල භාවිතා කල ඉලෙක්ට්‍රෝනික හා ගුවන් විදුලි / දුරකථන උපකරණ අලුත්වැඩියා කටයුතු ඉටු කිරීම සඳහා වර්ෂ 1964 දී සංඥා මූලික වැඩපල බණ්ඩය සංඥා බලකායට එක් වු අතර, එය 1 වන



සංඥා මූලික වැඩපල අටවන සේනාවිධායක වශයෙන් ලුතිතන් කර්නල් කේඑම්පී බණ්ඩාරනායක පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී සේනාවිධායක තනතුරෙහි වැඩ භාර ගැනීමේ අවස්ථාව.

ශ්‍රී ලංකා සංඥා බලකායේ 2 වන බළඝණය යටතේ පනාගොඩ එච් බණ්ඩය ලෙස ස්ථාපනය කරන ලදී. ආරම්භක වකවානුව තුල එච් බණ්ඩය වෙත පවරන ලද රාජකාරීන් වනුයේ යුධ හමුදාව තුල භාවිතා කරන ලද සියලු ගුවන් විදුලි උපකරණ / හඬ පටිගත කිරීමේ උපකරණ/ජන ඇමතුම් උපකරණ / වෙනත් ඉලෙක්ට්‍රෝනික උපකරණ / කැමරා / ප්‍රොජෙක්ටර් සහ බැටරි සඳහා පරීක්ෂණ කටයුතු, අලුත්වැඩියා කටයුතු හා අයෝග්‍ය කිරීම සිදු කිරීම / පනාගොඩ කොට්ඨාශය, යාපනය කොට්ඨාශය සහ මන්නාරම කොට්ඨාශය යටතේ ස්ථාපිත වු නීති විරෝධී කාර්යයන් මැඩලීමේ බලඝණය TAFII (Task Anti Force Illicit Immigrate) හි බැටරි

ආරෝපණ කටයුතු සිදු කිරීම / යුධ හමුදා මූලස්ථාන ප්‍ර ශාඛාවේ උපදෙස් පරිදි ජන ඇමතුම් උපකරණ සේවා සැපයීම වැනි කාර්යයන් වේ. එමෙන්ම ඉහත රාජකාරීන් ඉටු කිරීම සඳහා එම් බණ්ඩ සංවිධානය අංශ තුනකින් සමන්විත විය.

අ. ගුවන් විදුලි අලුත්වැඩියා අංශය / දුරකථන උපකරණ අලුත්වැඩියා අංශය.

ආ. විවිධ අලුත්වැඩියා අංශය.

ඇ. කාර්මික ගබඩා අංශය.

යුධ හමුදා සංවිධානයෙහි ව්‍යාප්තිය හා සමගාමීව සංඥා බලකායද ව්‍යාප්ත වු අතර, යුද හමුදාව වෙත ලබා ගන්නා ලද නව තාක්ෂණික ගුවන් විදුලි උපකරණ, දුරකථන හුවමාරු හා දුරකථන උපකරණ, රේඩියෝ රිලේ උපකරණ හා වෙනත් ඉලෙක්ට්‍රෝනික උපකරණ පිළිබඳ අලුත්වැඩියා / නඩත්තු කටයුතු පහසු කරමින් 1991 අගෝස්තු මස 01 වන දින සිට බණ්ඩයක් වශයෙන් වු සංඥා මූලික වැඩපල සංඥා මූලික වැඩපල බලඝණයක් ලෙස ව්‍යාප්ත විය. බලඝණයක් වශයෙන් නිළධාරීන් 10 ක් හා සෙසු නිළයින් 309 කින් සමන්විත සංස්ථාවකින් යුක්තව පාලනමය අවශ්‍යතා සඳහා



සංඥා මූලික වැඩපල 14 වන සංවත්සරය වෙනුවෙන් පැවති වැඩසටහන් මාලාවේ විශේෂ අවස්ථා





1 ශ්‍රීලංසංබ යටතේ සහ පසුකාලීනව එනම්, 1999 සැප්තැම්බර් මස 17 දින සිට සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතේ පහත බණ්ඩයන්ගෙන් සමන්විතව නව මුහුණුවරකින් සිය කාර්යයන් ඉටු කරන ලදී.

සංස්ථාව, මූලස්ථානය, බලඝණ 04 කින් හා ක්ෂේත්‍ර සංඥා වැඩපල 05 කින් හා මධ්‍යම සංඥා වැඩපලකින් සමන්විත වන අතර එම සංයුතිය ඇතිව 2015.04.24 දින සංඥා මූලික



සංඥා මූලික වැඩපලට එක්වු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2014.11.10 වන දින සංඥා බලකාධිපති හා ප්‍රධාන සංඥා නිළධාරී තුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කිරීමේ අවස්ථාව

අ. ගබඩා බණ්ඩය

ආ. එම් 1 බණ්ඩය සිට එම් 9 බණ්ඩය දක්වා

වර්ෂ 1991 අගෝස්තු මස 01 දින සිට වර්ෂ 2000 අගොස්තු 13 දින දක්වා සංඥා මූලික වැඩපල බලඝණය බලඝණ නිළධාරී අණදෙන්නන් 08 දෙදෙනකු යටතේ සිය කාර්මික වගකීම් යුද හමුදාවට ඉටු කල අතර, මෙම වකවානුව තුල ශ්‍රී ලංකාව තුල පැවති බෙදුම්වාදී ත්‍රස්ථවාදී යුද්ධයේදී තාක්ෂණික හා කාර්මික රාජකාරී අවශ්‍යතා නොපිරිහෙලා ඉටු කරන ලදී. වර්ෂ 2000 අගෝස්තු මස 13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නිළධාරීන් 24 ක් හා සෙසුනිළයන් 513 කින් සමන්විත වු ව්‍යුහයකින් යුක්තව 28/2001 හා 2001 අගෝස්තු මස 21 දින දරණ හමුදා චරියා නියෝග මගින් සංඥා මූලික වැඩපල ස්වාධීන ඒකකයක් ලෙස සංඥා බලකායට එක්විය. එමෙන් සංඥා මූලික වැඩපල

වැඩපල නැවත ප්‍රතිස්ථාපනයවී එය 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය (සන්නිවේදන තාක්ෂණ) වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා රෙජිමේන්තුවේ නව ඒකකයක් වශයෙන් එක්වන ලදී.

වර්ෂ 2015.04.24 දින දක්වා සංඥා මූලික වැඩපල පැවති තනතුරු වෙනස්වී සේනාවිධායක තනතුර කටයුතු කල ලුතිතන් කර්නල් කේඑම්පී බණ්ඩාරනායක පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී තුමා අණදෙන නිළධාරී වශයෙනුත් මාණ්ඩලික නිළධාරී 11 තනතුරේ කටයුතු කල මේජර් ඩීඑම්එස් දිසානායක පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී තුමන් ඒකක දෙවන අණදෙන නිළධාරී වශයෙන් හා වැඩ මූලික වශයෙන් කටයුතු කල බනි 11 ජයමාන්න එඑස්එස් යන බලලත් නිළධාරී රෙසැමේ වශයෙන් තනතුරු වෙනස් විය. එසේම විධායක අධිකාරී තනතුර, උපකරණ පාලක නිළධාරී තනතුර හා සරබ උපදේශක යන තනතුරු එක්විය.

සංඥා මූලික වැඩපල සිය 14 වන සංවත්සරය 2014.08.13 දින සමරන ලද අතර, ඊට සමගාමීව වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ලේ දන්දීමේ ව්‍යාපාරයක් පවත්වන ලදී. ඊට අමතරව මෙම ඒකක සියලුම නිළධාරීන් හා සෙසුනිළයින්ගේ සහභාගිත්වයෙන් දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදී. එසේම බලඝණ අතර ක්‍රීඩා තරඟ පැවැත්වීම / සියලු නිළ සුහද හමුව හා



10. වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය ප්‍රථම අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් කේඑම්පී බණ්ඩාරනායක පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමා වෙත පිරිනමන ලද සම්මාන මුරය හා එම තනතුරෙහි වැඩ භාර ගැනීමේ අවස්ථාව



2015.06.15.16 හා 17 දින මෙම ඒකකය වෙතින් පවත්වන ලද අන්තර් සංඥා ඒකක වොලිබෝල් තරඟාවලියේ විශේෂ අවස්ථා

ඒකකයට සෙත් පතා බෝධිපූජා පිංකමක් පවත්වන ලදී.

මෙම ඒකක සේනාවිධායක තනතුරේ පුරා වසරකට ආසන්න කාලසීමාවක් එනම් 2013.01.18 දින සිට 2013.11.26 දින දක්වා රාජකාරී කල ලුතිතන් කර්නල් පීඑල්එස්ඩබ්ලිව් ලියනගේ පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරී රාජකාරී කර ස්ථාන මාරුවීම් ලබා යාමෙන් අනතුරුව එදින සිට සංඥා මූලික වැඩපල සේනාවිධායක තනතුර ලුතිතන් කර්නල් කේඑම්පී බණ්ඩාරනායක පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් හොබවන ලදී.

යුද්ධය අවසන් වී වසර හයක් ගෙවීමෙන් පසු 67 වන නිදහස් දින උත්සවය හා හයවන වරට පවත්වන ලද රණවිරු උපහාර පෙළපාලිය සඳහා සක්‍රියව දායකත්වය ලබාදෙන ලදී. ඒ සඳහා සියලුම ජන ඇමතුම් රාජකාරීන් මෙම ඒකකය වෙත පැවරුනු අතර, එම සේවාවන් අවසන් කිරීමට හැකිවීම මෙන්ම රණවිරු උපහාර පෙළපාලියේ මෙම ඒකකය විසින් සංවිධානය කරන ලද ගුවන් විදුලි යන්ත්‍ර රැගත් රථ පෙළපාලිය ද ඉතාමත් උසස් අයුරින් සංවිධානය කර ප්‍රදර්ශණය කිරීමට හැකිවීම අප ලැබූ තවත් ජයග්‍රහනයක් ලෙස සැලකිය හැකිය.

මෙම ඒකකයේ කාර්මික නිළධාරීන් හා සෙසුනිළයින් කාර්මික රාජකාරීන්ට අමතරව ගිය වසරේ මෙන්ම මෙම වසරේද අන්තර් සංඥා ඒකක ක්‍රීඩා හා වෙනත් ක්‍රීඩා කටයුතු වෙනුවෙන් සහභාගිවී ජයග්‍රහණ ලබාගන්නා ලදී. එමෙන්ම 2015 වසර අන්තර් ඒකක තරග වෙනුවෙන් බැඩ්මින්ටන්, වොලිබෝල්, එල්ලේ හා බේස්බෝල් යන ක්‍රීඩා සංවිධානය කර පැවැත්වීමටද මෙම මූලික වැඩපල වෙත පැවරුනු තවත් රාජකාරියක් විය. එම තරඟ මාලාවන් අතරින් අන්තර් ඒකක වොලිබෝල් තරඟාවලියෙන් ජයග්‍රහණය මෙම ඒකක කණ්ඩායම විසින් ලබා ගන්නා ලදී. එමෙන්ම ඉදිරියේදී පැවැත්වීමට නියමිත ක්‍රීඩා තරඟ සඳහා ක්‍රීඩා කණ්ඩායම් මෙම ඒකකය වෙත ගෙන්වා ඉතාමත් උසස් අන්දමින් පැවැත්වීම සඳහා සැලසුම්කර ඇත.



සංඥා මූලික වැඩපල කාර්මික සෙනින් කාර්මික කටයුතු වල නියලී සිටින ආකාරය

තවද 2015 වසරේ වෙසක් උත්සවය නිමිත්තෙන් ආසේමු (බටහිර) විසින් වෙසක් කලාපයක් සංවිධානය කර එය යුහ බෝධිරාජාරාමය තුල පවත්වන ලදී. මෙම වෙසක් කලාපය සඳහා සංඥා බලකාය වෙතින් ඉදිරිපත් කරනු ලබන වෙසක් පහන් කූඩුව නිර්මාණය කිරීමේ කටයුතු මෙම ඒකකය වෙත පැවරනු අතර, මෙම ඒකක නිළධාරීන් හා සෙසුනිළයින් විසින් බුදු ගෙමඟුල පිළිඹිබු වන පරිදි යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන දර්ශණීය පහන් කූඩුවක් නිර්මාණය කර ප්‍රදර්ශණය කරන ලදී.

එලබෙන වසරේදී 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ නිළධාරීන්ට හා සෙසුනිළයින්ට ගිය වසරේ මෙන්ම සංඥා බලකායට කීර්තියක් ලබාදීමට හැකියාවක් ඇති වන පරිදි ලෝකයේ දියුණු වන තාක්ෂණයට සමගාමීව දේශිය හා විදේශිය පාඨමාලාවන් ලබාදීම තුලින් හා වෘත්තිය දැනුම වැඩි දියුණු කිරීම තුලින් යුද හමුදාවට ඇවැසි කාර්මික දැනුම එලදායි ලෙස ලබාදීමේ අදිටනින් එලබෙන අභියෝග යන්ට සාර්ථකව මුහුණදීමට අප බලාපොරොත්තු වෙමු.





## 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල පරිගණක භාවිතය ආරම්භවීම සින්ක්ලෙයාර් පරිගණකයේ පැමිණීමත් සමග සිදුවූ අතර, 1985 වර්ෂයේදී පරිගණක කමිටුව නමින් කමිටුවක් යුද්ධ හමුදා මූලස්ථානය තුල ආරම්භ කරමින් එවකට යුද්ධ හමුදාවේ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා තොරතුරු සහ දත්ත පරිගණකගත කිරීම ආරම්භ කරන ලදී. තොරතුරු සන්නිවේදන තාක්ෂණය සීඝ්‍ර දියුණුවක් ලබමින් පවතින මේ අවස්ථාව වන විට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවද ඒ හා සමගාමීව ඉදිරියට යා යුතු වූ බැවින් 1990 දශකයේ මුල් භාගය වන විට පරිගණක ගණන 50 කින් පමණ යාවත්කාලීන කරන ලද යුද්ධ හමුදා පරිගණක ක්‍රියාවලිය සඳහා ඒ වන විට දායක වූ වෘත්තිය පරිගණක නිළධාරීන් ගණන 20 ක් පමණ වූ අතර සෙසුනිළයින් 25 දෙදෙනකු පමණ විය.

1991 අගෝස්තු මස 23 වන දින "විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය" නමින් මෙම ඒකකය ආරම්භ කිරීමෙන් අනතුරුව 2003 ඔක්තෝබර් මස 14 වන දින අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික යටතේ නව ඒකකයක් වශයෙන් ආරම්භ කරන ලද අතර, තොරතුරු තාක්ෂණය යුද්ධ හමුදාව තුල ව්‍යාප්ත වීමත් සමග පරිගණක රාජකාරීන් වෙනුවෙන් ඒකක බල සංඛ්‍යාවද වර්ධනය වන්නට විය. මෙතෙක් යුද්ධ හමුදා මූලස්ථානයෙහි ස්ථාපනය කර තිබූ මෙම ඒකකය 2009 නොවැම්බර් මස 17 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත රැගෙන එන ලදී.



අණදෙන නිළධාරී වශයෙන් රාජකාරී කරනු ලැබූ ලුතිතන් කර්නල් කේසී ප්‍රතාපසිංහ ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමන් තනතුර අත්හැරීම වෙනුවෙන් පිරිනමන ලද සම්මාන මුරය

සංඥා රෙජිමේන්තුව තුල නූතනයේ පවතින තොරතුරු තාක්ෂණයේ අවශ්‍යතාවය මත 2010 සැප්තැම්බර් මස 21 දින සිට 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ලෙස පිහිටුවන ලද අතර, ප්‍රථම අණදෙන නිළධාරීතුමන් ලෙස ලුතිතන් කර්නල් පීඑන්යූ ජයරත්න යන ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමා පත්වන ලදී.

11 වන සංඥා බලකායේ ආරම්භයේදී තොරතුරු තාක්ෂණ නිළධාරීන් 61 කින් සහ සෙසුනිළයින් 600 කින් සමන්විත විය. ප්‍රධාන සංඥා නිළධාරීතුමන්ගේ දිගු දැක්ම හා නව සංකල්පයකට අනුව යුද්ධ හමුදාවේ තොරතුරු තාක්ෂණය වඩාත් පුළුල් කිරීමෙහි ලා අරමුණකින් සංඥා



11 ශ්‍රීලංසංබ ඒකකයේ 3 වන අණදෙන නිළධාරී වශයෙන් 2015.02.09 වන දින ලුතිතන් කර්නල් එස්පීපී පසෂවීර ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමන් වැඩ භාර ගැනීම

බලකායේ ආධාරක බලඇණියක් වූ 6 වන සංඥා බලකාය ද තොරතුරු තාක්ෂණ ඒකකයක් වශයෙන් ප්‍රතිසංවිධානය කිරීම සිදුකර ඇත.

දැනට මෙම ඒකකය සතු බලසංඛ්‍යාව නිළධාරීන් 30 ක් සහ සෙසුනිළයින් 764 ක් වෙති. ඔවුන් යුද්ධ හමුදාව තුල සෑම ආයතනයක් තුලම තම සේවාවන් ලබාදෙමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තොරතුරු තාක්ෂණය වර්ධනය කිරීම සහ වඩාත් කාර්‍යක්‍ෂමව පවත්වාගෙන යාම සඳහා තම දායකත්වය ලබාදෙමින් සිටියි.



ලුතිතන් කර්නල් එස්පීපී පක්‍ෂවීර ජ්‍යෙෂ්ඨ නිළධාරීතුමන් අණදෙන නිළධාරී තනතුරේ වැඩභාර ගැනීම වෙනුවෙන් රුක් රෝපණයක් සිදුකරන ලද මොහොත

සංඥා බලකාධිපතිතුමන්ගේ නව දැක්ම යටතේ මෙම ඒකකයට මහත් අඩුපාඩුවක්ව පැවති ගොඩනැගිලි පහසුකම් හිගතාවයට විසඳුමක් ලෙස නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කර 2015.08.06 දින අධ්‍යක්‍ෂ තොරතුරු තාක්ෂණ විසින් විවෘත කරන ලදී.



අභිනවයෙන් ඉදිකරන ලද නව දෙමහල් ගොඩනැගිල්ල විවෘත කල මොහොත

දිනෙන් දින වඩ වඩාත් ප්‍රවර්ධනය වෙමින් පවතින තොරතුරු තාක්ෂණය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුලද ප්‍රචලිත කර යුද්ධ හමුදාවේ කාර්යන් වඩාත් කාර්‍යක්‍ෂම අන්දමින් ඉටු කරගැනීම වස් අප ඒකකයන් විසින් ලබාදෙනු ලබන දායකත්වය ඉදිරියේදී වඩාත් පුළුල් කිරීමට කටයුතු කිරීම අප සැමගේ වගකීම වන්නේය.



2015 - සිංහල හා හින්දු අලුත් අවුරුදු උළෙල වෙනුවෙන් අවුරුදු කුමරිය තරඟය සංවිධානය කිරීම



මෙම ඒකකය වෙතින් සංවිධානය කරනු ලැබූ අන්තර් ඒකක මේසපන්දු තරඟාවලිය - 2015





## සංඥා පුහුණු පාසල

වර්ෂ 1964 දී පලමුවන සංඥා බලකාය යටතේ පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ ගොඩනැගිලි 2 ක් තුල ප්‍රධාන උපදේශකවරයෙකු , පාලන අංශභාර ජ්‍යෙකොනොනියෙකු , සරඹ උපදේශකයෙකු හා ලිපිකරුවන් 04 දෙනෙකුගෙන් යුතුව පැවති සංඥා අභ්‍යාස බලඝණය 1991.07.15 දින ප්‍රධාන උපදේශක වශයෙන් කපිතන් කේඑම්ආර්පී කරුණාතිලක නිළධාරීගේ අණදීම යටතේ ලෝක උරුම නගරයක් වන ඓතිහාසික මහනුවර, ප්‍රදේශයේ බුවැලිකඩ නම් ග්‍රාමයේ මනරම් කඳු මුදුනක මෙම සංඥා පුහුණු පාසල ස්ථාපනය කරන ලදි. 25 වන වියට පාතබා ඇති සංඥා පුහුණු පාසල මේ දක්වා සේනාවිධායකවරුන් 19 දෙනෙකුගේ මග පෙන්වීම සහ ප්‍රධාන උපදේශකවරුන් 25 දෙනෙකුගේ අධීක්‍ෂණය යටතේ තම ඉදිරි ගමන සිදුකර ඇත. මෙම පුහුණු පාසලේ වත්මන් සේනාවිධායක වශයෙන් කර්නල් කේඑඩබ්එස් රත්නායක යන ජ්‍යෙෂ්ඨ නිළධාරී කටයුතු කරනු ලබන අතර, ප්‍රධාන උපදේශක වශයෙන් මේජර් එඑම්ටී අමරකෝන් පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරී කටයුතු කරනු ලබයි.



සංඥා පුහුණු පාසලේ 24 වන සංවත්සරය වෙනුවෙන් සේනාවිධායකතුමා වෙත සම්මාන මුරයක් පිරිනැමූ අවස්ථාව

සංඥා පුහුණු පාසල තම පුහුණු දායකත්වය ත්‍රිවිධ හමුදාවට හා පොලීසියට පමණක් සීමා නොකොට රාජ්‍ය ආරක්‍ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ අනුමැතිය මත විශ්ව විද්‍යාල වරම් ලද ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් නායකත්ව පුහුණු වැඩ සටහන් මෙන්ම පාසල් සිසුන් සඳහාද විශේෂ පුහුණු කටයුතු මෙන්ම දේශණ සිදු කරමින් සංඥා බලකායේ අභිමානය රැකගනිමින් සංඥා පුහුණු පාසල දිගු ගමනක් ගමන් කරමින් සිටී.

වත්මන් සේනාවිධායක තුමාගේ මග පෙන්වීම යටතේ මෙම පුහුණු පාසල උසස් තත්වයකට නංවාලීමේ අරමුණින් යුතුව පාඨමාලා සිසුන්ගේ අධ්‍යාපන කටයුතු වලට පහසුවක් ගෙන දෙමින් දේශන ශාලා 03 ක් නවතමයෙන් සකස් කරන ලදි. එමෙන්ම ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සඳහා සංඥා පුහුණු පාසලේ නවතමයෙන් ඉදිකල "Breezy Cottage" නිවාඩු නිකේතනයද, ප්‍රතිසංස්කරණය කරන ලද ගුවන් විදුලි කෞතුකාගාරයද, නවතමයෙන් ඉදිකෙරෙමින් පවතින කායවර්ධන මධ්‍යස්ථානය හා වෛද්‍ය



ප්‍රධාන මාණ්ඩලික නිළධාරී මෙන්ම සංඥා බලකාධිපතිව කටයුතු කල මේජර් ජෙනරාල් එස්එපිපි සමරසිංහ ආර්එස්පි යූඑස්පි පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරී 2015.03.20 දින මාබේරිතැන්න පුහුණු අනු ඛණ්ඩය තුල නිරීක්‍ෂණ චාරිකාවක නිරත වූ අයුරු

සැරවුම් මධ්‍යස්ථානය සංඥා පාසලේ දියුණුව ගැන සාක්ෂි දරයි.

2014 දෙසැම්බර් අගභාගයේ රට පුරා ඇතිවූ අයහපත් කාලගුණය හේතුකොටගෙන ඇති වූ නායා යෑම් හා පස් කඳු කඩා වැටීමෙන් සංඥා පාසලටද බරපතල ලෙස අලාභහානි සිදුවූයේ පුහුණු කටයුතු පවා සිදුකරගෙන යාමට නොහැකි ලෙසටය. ඒ හේතුවෙන් 2014.12.26 දින නිළධාරීන් 01 හා සෙසුනිළයින් 17 යුතු ප්‍රමාණයක් මාබේරිතැන්න 5 යාන්ත්‍රික පාබල බලඇණියේ පසුමුලයෙහි ස්ථාන ගත කර එහි පුහුණුවීම් කටයුතු සිදු කරගෙන යාමට කටයුතු ආරම්භ කරන ලදී.

සංඥා පාසලේ ආරම්භයේ සිට මේ දක්වා සිටි සේනාවිධායකවරුන්ගේ, ප්‍රධාන උපදේශකවරුන්ගේ, අනෙකුත් නිළධාරීවරුන්ගේ, රෙජිමේන්තු සැරයන් මේජර්වරුන්ගේ හා සෙසු නිළයින්ගේ කැපවීම සහ ක්‍රියාකාරකම් හේතුවෙන් සංඥා පුහුණු පාසල ඉමහත් දියුණුවක් සහ ප්‍රසිද්ධියක් ලබා ඇත. තවදුරටත් සංඥා බලකායේ දැනුම් උල්පත බඳුවූ සංඥා පාසල් මෑණියන්ට දිගුකලක් බැබලීමට දළදා සමිඳුන්ගේ ආශීර්වාදය නිබඳව ලැබේවායි පතන්නෙමු.

පසුගිය කාලපරිච්ඡේදය තුල සිදුවූ විශේෂිත අවස්ථා කිහිපයක් මෙසේ දිග හැර පෙන්වමි.



ආසෙමු (මධ්‍යම) ආඥාපති වන මේජර් ජෙනරාල් එකේඑස් පෙරේරා ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියු යන ජ්‍යේෂ්ඨ නිළධාරී 2015.06.18 දින සංඥා පාසලේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූ අවස්ථාව



2015 සිංහල හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් සංඥා පුහුණු පාසල මගින් සංඥා පාසලේ සේවය කරනු ලබන කාර්‍ය මණ්ඩලයේ පවුල් වල සාමාජිකයින් සඳහා සංවිධානය කරන ලද බක් මහ උළෙලේ විශේෂ අවස්ථාවන් කිහිපයක්



නවීකරණය කරන ලද සංඥා පාසල් කෞතුකාගාරය



නවතමයෙන් ඉදිකරන ලද සංඥා පාසල් ගෘහස්ථ ක්‍රීඩාගාරය සහ වෛද්‍ය පරීක්ෂණාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු සිදුකරන අතරතුර



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2015





වෙසක් සහ පෙසොන් පොහොයවල් නිමිති කොට සංඥා පාසල විවිධ ආගමික උත්සවයන් සංවිධානය කරමින්



විද්‍යුත් සංග්‍රාමික පාඨමාලාවේ සිසුන් අභ්‍යාසයක යෙදෙමින්.



නිළ උසස් කිරීමේ පාඨමාලා සෙනින් වන අභ්‍යාසයක යෙදෙමින්



නාවික හමුදා භටපිරිසක් අධ්‍යයන චාරිකාවක් සඳහා සංඥා පුහුණු පාසලට පැමිණි අවස්ථාවක්



